වාර්ෂික වාර්තාව 2017

ශ්‍රී ලංකා සංචාරක
සංවර්ධන අධිකාරිය

SRI LANKA

2017

වාර්ෂික වාර්තාව

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

පටුන

1. දැක්ම, මෙහෙවර සහ මාර්ගෝපදේශ මූලධර්ම 3
2. ගරු අමාත්‍යතුමාගේ පණිවුඩය 6
3. සභාපතිතුමාගේ පණිවුඩය 8
4. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය 9
5. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය 10
6. ගෝලීය සංචාරක කර්මාන්තය පිළිබඳව දළ විග්‍රහයක් 11
7. ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය පිළිබඳ දළ විශ්ලේෂණයක් 12
8. 2017 වර්ෂයේ ලබා ගත් ජයග්‍රහණ 14
   - 8.1 සංචාරක කර්මාන්තය සඳහා අගය එකතු කිරීම 14
   - 8.2 නිවාඩු නිකේතන කළමනාකරණය සහ සංවර්ධනය 17
   - 8.3 ප්‍රමිති සහ තත්ත්ව ආරක්ෂණය 20
   - 8.4 ජාත්‍යන්තර අත්දැකීම් ලබා ගැනීම සහ ධාරිතා සංවර්ධනය 24
   - 8.5 දේශීය සංචාරක ව්‍යාපාරය සහ ප්‍රජා සම්බන්ධතා (DT & CR) 26
   - 8.6 අප ආයතනයේ සේවකයන් 29
   - 8.7 මෙහෙයුම් පිළිබඳ වෙනත් තොරතුරු 30
9. මූල්‍ය සම්බන්ධ විශේෂ අවස්ථා 32
   - 9.1 කාර්යසාධනය පිළිබඳ විශේෂ අවස්ථා 33
10. මූල්‍ය ප්‍රකාශන 37
    - 10.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය 39
    - 10.2 සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය 40
    - 10.3 හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය 41
    - 10.4 මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය 41
    - 10.5 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 42
11. විගණකාධිපතිතුමාගේ වාර්තාව 63

දැක්ම

අව්‍යාජ සහ විවිධාකාර අත්දැකීම් සහිත
මතකයේ රැඳෙන ලෝකයේ හොඳම දූපත ලෙස
පිළිගැනීමට පාත්‍ර වීම

මෙහෙවර

ශ්‍රී ලංකාවේ ස්වාභාවික හා සංස්කෘතික උරුමයන්, සමාජීය වශයෙන් පරිපූර්ණ සහ
පරිසර හිතකාමී අයුරින් පිළිඹිබු වන අතිවිශිෂ්ට අත්දැකීමක් බවට පත් කිරීම
සහ ඉහළ වටිනාකමක් ලබා දීම තුලින් ආර්ථික ප්‍රතිලාභ ප්‍රජාවට සහ රටට ලබා දීම.

මාර්ගෝපදේශ මූලධර්ම

1 **සංචාරක කර්මාන්තයේ ප්‍රතිලාභ ශ්‍රී ලංකාව වෙත අත්පත් කර ගැනීම:**
ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට සහ විවිධාංගීකරණය සඳහා සංචාරක කර්මාන්තය කැපී පෙනෙන දායකත්වයක් ලබා දෙයි. ඒ අනුව, සංචාරක කර්මාන්තය ආර්ථිකයේ ප්‍රධාන ආධාරක ක්ෂේත්‍රයක් වන අතර රජයේ තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී ප්‍රමුඛත්වය ලබා දිය යුතු ක්ෂේත්‍රයක් ද වේ. සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීමේ ක්‍රියාවලියේ දී, රාජ්‍ය අංශයෙන් පහසුකම් ලබා ගනිමින් පුද්ගලික අංශය මූලිකත්වය ගෙන කටයුතු කිරීම අවශ්‍ය වේ.

2 **ආර්ථික වර්ධනය සඳහා සෑම පුද්ගලයකුටම සහභාගී වීමේ හැකියාව:**
ශුද්ධ විදේශ විනිමය ආදායම උපරිමකරණය කිරීම, සංවර්ධනය දිවයින පුරා ව්‍යාප්ත කිරීම, ශ්‍රී ලාංකිකයන් සඳහා ඵලදායී රැකියා අවස්ථා ඇති කිරීම තුළින් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ප්‍රශස්ත ආර්ථික ප්‍රතිලාභ ලබා දීම සංචාරක කර්මාන්තය මගින් ඉටු කර ගත යුතු වේ. සංචාරක කර්මාන්තයේ ප්‍රගතිය මගින් සියලුම පාර්ශ්වකරුවන්ට සාධාරණ ලෙස බෙදී යන සමාජ ආර්ථික ප්‍රතිලාභ ලැබෙන පරිදි, වටිනාකම් දාමය උත්තේජනය කිරීම සහ වඩාත් ශක්තිමත් කිරීම ද, ප්‍රායෝගික දීර්ඝකාලීන ආර්ථික මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක වීම තහවුරු කිරීම ද කළ යුතුය.

3 **වත්කම් සංරක්ෂණය කිරීම සහ ඉහළම මට්ටමින් කළමනාකරණය කිරීම:**
ශ්‍රී ලංකාවේ ස්වභාවික පරිසරයට හානිකර බලපෑම් සිදුවීම වළක්වමින් එය සංරක්ෂණය කිරීම සහ වැඩි දියුණු කිරීම මෙන්ම එහි ඓතිහාසික, සමාජීය හා සංස්කෘතික උරුමය සංරක්ෂණය කිරීම සහ වැඩි දියුණු කිරීම. අත්‍යවශ්‍ය පාරිසරික ක්‍රියාවලි පවත්වා ගනිමින් ද, ස්වභාවික ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීමට උපකාර කරමින් ද පාරිසරික සම්පත් ප්‍රශස්ත අන්දමින් පරිහරණය කළ යුතුය.

4 **දේශීය ප්‍රජාවේ සහභාගීත්වය:**
සංචාරක කර්මාන්තය මගින් සත්කාරක ප්‍රජාවල සමාජ සංස්කෘතික අව්‍යාජත්වයට ගරු බුහුමන් දැක්විය යුතු වන අතර එම ප්‍රජා විසින් ස්ථාපනය කරන ලද ජීවමාන සංස්කෘතික උරුමය සහ සම්ප්‍රදායානුකූල වටිනාකම් ද සංරක්ෂණය කළ යුතුය. එමෙන්ම, සංස්කෘති පිළිබඳ අවබෝධ කර ගැනීමට සහ විවිධ සංස්කෘතිවල පැවැත්ම උපේක්ෂාවෙන් දරා ගැනීමට දායක විය යුතුය. දේශීය ප්‍රජාවල තථ්‍ය සහ සාකල්‍ය ධාරිතාව සංචාරක කර්මාන්ත සංවර්ධනය තුළ ද ඇතුළත් විය යුතුය. ප්‍රාදේශීය සහ දේශීය රජය ඇතුළත්ව ප්‍රබල දේශපාලනික නායකත්වය මගින් දැනුවත්බවක් සහිත අදාළ සියලුම පාර්ශ්වකරුවන්ගේ පුළුල් සහභාගීත්වය ලබා ගැනීම දිරිගැන්විය යුතු අතර පොදු එකඟත්වය ඇති වීමට ද සහාය ලබා දිය යුතුය.

5 **උරුමය තුළ මුල් බැස ඇති අමතක නොවන අත්දැකීම්:**
සියලුම සංචාරක කර්මාන්ත සේවා සහ ක්‍රියාකාරකම් සංචාරකයා කේන්ද්‍රගත කරමින් සිදු කළ යුතු අතර එම ක්‍රියාකාරකම් ශ්‍රී ලංකාවේ පාරිසරික, ආගමික, සමාජීය සහ සංස්කෘතික උරුමය තුළ මුල් බැස තිබිය යුතුය. සංචාරක කර්මාන්ත සේවා සහ ක්‍රියාකාරකම් මගින් සංචාරකයාට ඉහළ මට්ටමේ තෘප්තියක් සැපයිය යුතු අතර සංචාරකයාට ඉගෙනීමේ අවස්ථා ලබා දෙමින් ද, විශිෂ්ඨතම සංචාරක පරිචයන් පිළිබඳව දැනුවත්බව වැඩි දියුණු කරමින් ද, සංචාරකයාට අර්ථවත් අත්දැකීම් ලබා ගැනීමේ හැකියාව පවතින බව තහවුරු කළ යුතුය.

6 **වගකිවයුතු ගමනාන්ත අලෙවිකරණය:**
ශ්‍රී ලංකාවේ සුවිශේෂී පරිසරය, සම්ප්‍රදාය සහ ආකර්ෂණ විශේෂයෙන් ඉස්මතු කරමින් වගකීමෙන් යුක්තව ශ්‍රී ලංකාව අලෙවි කළ යුතුය. අප දිවයින සහ සංචාරක කර්මාන්තය පිළිබඳව චිරාත් කාලයක් මුළුල්ලේ පවතින දුර්මත පහ කිරීමට ද ප්‍රයත්න දැරිය යුතුය.

7 **සියලු දෙනාට ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය:**
සියලුම සංචාරකයන්, ආයෝජකයන් සහ ප්‍රජාව මෙන්ම සතුන් සඳහා ද ආරක්ෂාකාරී සුරක්ෂිත පරිසරයක් තහවුරු කළ යුතුය.

සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය, ගරු ජෝන් අමරතුංග මැතිතුමාගේ පණිවුඩය

ශ්‍රී ලංකාවේ වත්මන් සංචාරක කර්මාන්තය ශීඝ්‍ර පරිවර්තනයකට ලක් වෙමින් පවතී. මෙම පරිවර්තනය මගින් ගෝලීය සංචාරක වෙළඳපොළ තුළ, ශ්‍රී ලංකාවේ තරඟකාරීත්වය ඉහළ නැංවෙනු ඇත. අප ඉහළින්ම අපේක්ෂා කළ පරිදි, සංචාරක කර්මාන්ත ක්‍රමෝපායික සැලැස්ම (TSP) සම්පාදනය කිරීම සඳහා දරන ලද ප්‍රයත්න හේතුවෙන් මෙම පරිවර්තන ක්‍රියාවලිය සාක්ෂාත් කර ගැනීමට හැකි වී තිබේ.

ක්‍රියාත්මක කිරීමට සූදානමින් පවතින මෙම සැලසුම මගින් අපගේ සංචාරක වත්කම්වලින් ලැබෙන ප්‍රතිලාභ වර්ධනය කිරීම සහ උපරිමකරණය කිරීම සඳහා ක්‍රමෝපායක් සංවර්ධනය කර ඇත. සංචාරක කර්මාන්තයේ සියලුම පාර්ශ්වකරුවන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය තුළින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති මෙම ක්‍රමෝපායික සැලැස්ම මගින් ඉදිරි වසර තුනක කාලය තුළ ගත යුතු ක්‍රියාමාර්ග සහ ඒවා ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණ නිර්දේශ කර ඇති අතර එම කාල සීමාව අවසානයේ දී, සංචාරකයන් මිලියන 4 ක් අප දිවයින වෙත ආකර්ෂණය කර ගැනීමට ද, පුද්ගලයන් 600,000 ක් සඳහා සෘජු සේවා නියුක්තියක් ඇති කිරීමට මෙන්ම ඇමෙරිකානු ඩොලර් බිලියන 5 කට අධික ආදායමක් ලැබීමට ද අපි අපේක්ෂා කරමු.

ශ්‍රී ලංකාවේ නිරිතදිග වෙරළ තීරයේ ඇතැම් ස්ථානවල පැවතෙන සංචාරක කර්මාන්තය හැරුණු විට, වෙනත් ස්ථානවල සංචාරක කර්මාන්තය සඳහා පවතින සුවිසල් විභවය මෙතෙක් අනාවරණය වී නොමැත. විශේෂයෙන්ම ඉහළ නැංවූ ආයෝජනය, රැකියා උත්පාදනය, පාරිසරික තිරසාරභාවය සහ දේශීය ආර්ථිකයන් සඳහා දායකත්වය යනාදී ආකාරවලින් සංචාරක කර්මාන්ත සංවර්ධනය සඳහා සුවිශාල විභවයක් ශ්‍රී ලංකාව සතු වේ.

සංචාරක කර්මාන්තය ආර්ථිකයේ ශක්තිමත් අංශයක් වශයෙන් සංවර්ධනය කිරීමේ ඒකාන්ත අරමුණ ද සමඟ සංචාරක කර්මාන්තය තිරසාර අන්දමින් සංවර්ධනය කිරීම සඳහා වඩාත් ඉහළ අවධානයක් රජය මගින් යොමු කර ඇත. විදේශීය ප්‍රේෂණ මගින් දිවයින වෙත ලැබෙන විදේශ විනිමය ප්‍රමාණය අතික්‍රමණය කරමින් සංචාරක කර්මාන්තය නුදුරු අනාගතයේ දී ම, දිවයිනේ විශාලතම විදේශ විනිමය උපයන්නා බවට පත් කිරීම සත්‍ය වශයෙන්ම අපගේ ඉලක්කය වේ. මෙම ඉලක්කය සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම පරිවර්තන අදියරේ ප්‍රමුඛ කාර්යභාරය සක්‍රීයව ඉටු කිරීම සඳහා සංචාරක කර්මාන්තයේ නිරතව සිටින පුද්ගලික අංශය මෙන්ම රාජ්‍ය අංශය ද මැනවින් සංවිධානය කර ඇත.

සංචාරක කර්මාන්තය සැලකීමේ දී, පුද්ගලික අංශය විසින් එම කර්මාන්තය මෙහෙයවනු ලබන අතර රාජ්‍ය අංශය පහසුකම් සපයන්නාගේ කාර්යභාරය ඉටු කරයි. සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ, කාමර 6000 කට ආසන්න ප්‍රමාණයක් ද සමඟ දිවයිනේ සංචාරක කර්මාන්තය සඳහා ලබා ගත හැකි කාමර ප්‍රමාණය ශීඝ්‍රයෙන් ඉහළ නඟිමින් පවතී. මෙයට අමතරව, 2017 වර්ෂයේ දී, නව සේවා සැපයුම්කරුවන් 250 ක් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී ඇත.

සංචාරක කර්මාන්තයේ අවිධිමත් අංශය සීමාරහිතව වර්ධනය වීම අපට මුහුණ පෑමට සිදු වී ඇති විශාලතම අභියෝගයක් බවට පත් වී ඇත. අනාගතයේ දී, සියලු සේවා සැපයුම්කරුවන් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වීම අනිවාර්ය කරවීමට අවශ්‍ය නෛතික රාමුව ක්‍රියාත්මක කිරීම මගින් මෙම අභියෝගය ජය ගැනීම සඳහා අපි වර්තමානයේ ක්‍රියාත්මක වන්නෙමු.

මෙම සේවා සඳහා මාර්ගගත වේදිකාවක් හඳුන්වා දීම මගින් ලියාපදිංචි කිරීමේ සහ බලපත්කරණ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව සහ සඵලදායී බව ඉහළ නැංවීමට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය කටයුතු කරන අතර නව සංචාරක නිකේතනවල විශේෂයෙන්ම උතුරු සහ නැගෙනහිර සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට ප්‍රයත්න දරයි. මෙම වාර්තාවේ පහත සඳහන් පිටුවල දැනට ක්‍රියාත්මකව පවතින කටයුතු සහ මෙම සංවර්ධන කටයුතු සඳහා වැය වූ පිරිවැය පිළිබඳ විස්තර දක්වා ඇත. වර්තමාන අවශ්‍යතා සපුරාලීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මගින් මෙහෙයවනු ලබන නිවාඩු නිකේතනවල තත්ත්වය ඉහළ නංවා යාවත්කාලීන කර ඇති බව සඳහන් කිරීමට ලැබීම පිළිබඳව විශේෂයෙන් සතුටු වෙමි.

ලබන්නා වූ වසර තුළ, දිගු කාලීන සමාජ ආර්ථික ප්‍රතිලාභ සමාන අන්දමින් බෙදා හැරීම තහවුරු කිරීම සඳහා උපකාර වන සංචාරක කර්මාන්තයේ වටිනාකම් දාමය ශක්තිමත් කිරීම මගින් බිම් මට්ටමේ සංවර්ධනය උත්තේජනය කිරීමට අපගේ අවධානය ස්ථිරව යොමු කර ඇත.

සංචාරක පැමිණීම් මෙන්ම ආදායම් යන දෙඅංශයෙන්ම ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තයේ තවත් වාර්තාගත වසරක් බවට 2017 වර්ෂය පත් කිරීම සඳහා ඉමහත් ප්‍රයත්නයක් දරන ලද ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා, අධ්‍යක්ෂ ජනරාල් සහ අධ්‍යක්ෂ මණ්ඩලයට මෙන්ම අනෙකුත් සියලු නිලධාරීන්ට ද ස්තුතිවන්ත වීම මා සතු යුතුකමක් වශයෙන් සලකමි.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සභාපති කිෂූ ගෝමස් මහතාගේ පණිවුඩය

2019 වසරේ පෙබරවාරි 6 වන දින ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සභාපති ධූරයේ රාජකාරී භාර ගැනීමෙන් අනතුරුව, ලබා ගත හැකි දත්ත, තොරතුරු සහ විශ්ලේෂණ මත පදනම්ව 2017 වර්ෂයේ කාර්යසාධනය ආවරණය කරමින් සභාපතිවරයාගේ සමාලෝචනය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව සතුටට පත් වෙමි. මේ වන විට ක්‍රියාත්මකව පවතින සිව් වසරක ක්‍රමෝපායික සැලසුමේ පළමු වසර වශයෙන්, සමාලෝචිත වර්ෂය තුළ විශිෂ්ට කාර්යසාධනයක් සාක්ෂාත් කර ගනීමට අපට හැකි වී ඇත.

ප්‍රේෂණ, රෙදිපිළි සහ ඇඟලුම්වලට පසුව, ශ්‍රී ලංකා ආර්ථිකයේ තෙවන විශාලතම අපනයන උපයන්නා බවට සංචාරක කර්මාන්තය පත්ව තිබේ. මෙම කරුණ තහවුරු කරමින්, 2017 වර්ෂයේ දී සංචාරක ව්‍යාපාරය මගින් ඇමෙරිකානු ඩොලර් බිලියන 3.9 ක මුළු ආදායමක් උපයා ගැනීමට සමත්ව තිබේ. මෙමගින්, දිවයිනේ දළ දේශීය නිෂ්පාදිතය සඳහා 4.5% ක සෘජු දායකත්වයක් ලබා දී ඇත. 2016 වර්ෂයේ සංචාරක පැමිණීම්වලට සාපේක්ෂව, 3.2% ක වර්ධනයක් වාර්තා කරමින්, 2017 වර්ෂයේ දී ශ්‍රී ලංකාව වෙත සංචාරකයන් 2,116,407 ක් පැමිණ තිබේ. දිනකට සංචාරකයකුගෙන් ලැබෙන විදේශ විනිමය ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් 170.1 ක් වේ. තවද, 2017 වර්ෂයේ සංචාරක කර්මාන්තයේ සමස්ත රැකියා උත්පාදනය 359,215 ක් වූ බව වාර්තා කිරීමට ලැබීම පිළිබඳව ද සතුටට පත් වෙමි.

සංචාරක කර්මාන්තය වසරේ ඕනෑම කාල සීමාවක යම් දේශයක් තුළ ඇති වන ස්වභාවික ආපදා, සිවිල් කෝලාහල සහ දේශපාලනික නොසන්සුන්තාවලින් බලපෑමට ලක් වන සංවේදී කර්මාන්තයකි. 2017 වසරේ දී සංචාරක කර්මාන්ත සංවර්ධනය සම්බන්ධයෙන් අභියෝගවලට මුහුණ පෑමට සිදු වුවද, ඉදිරි වසර වල දී සංචාරක කර්මාන්තයේ දැවැන්ත වර්ධනයක් වාර්තා කිරීමට මෙන්ම සංචාරක කර්මාන්තයේ ආයෝජනය කිරීමට ද විභවයක් පවතී 2017 වර්ෂය ද ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට එහි කාර්යසාධනය වඩාත් ප්‍රබල අන්දමින් සපුරා ගැනීමට හැකි වූ තවත් සුවිශේෂී වසරක් විය. සංචාරක ව්‍යාපාරයේ සෑම අංශයකම වර්ධනය සඳහා කැපී පෙනෙන අවස්ථා පවතින අතර සංචාරක කර්මාන්තයේ අභිවෘද්ධියට හේතු වන නව ව්‍යාපෘති සහ නිෂ්පාදන වෙනුවෙන් ආයෝජනය කිරීම සඳහා ප්‍රමුඛත්වය ලබා දීමට ද අපි අඛණ්ඩව කටයුතු කරන්නෙමු.

වසර 2025 වන විට, සංචාරකයන්ගේ සිත්සතන්වල රැඳී පවතින, අව්‍යාජ, විවිධාකාර සංචාරක අත්දැකීම් ලැබිය හැකි දේශයක් වශයෙන් ශ්‍රී ලංකාව හඳුනා ගනු ඇතැයි අපි උදක්ම අපේක්ෂා කරමු.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ කළමණාකරන මණ්ඩලය

වමේ සිට දකුණට:
පළමුවන පේළිය: පී.ඒ. රත්නායක මහතා (සාමාජික), පී. අල්ගම මහතා (සාමාජික), කිෂූ ගෝමස් මහතා (සභාපති), එම්. ආත්තිකුමාර් මහතා (සාමාජික)
දෙවන පේළිය: කාඛින්දූ මහකලන්දූ මහතා (සාමාජික), කිලෙන් සිරිසිංහ මහතා (සාමාජික), ට්‍රෙවෝ රාජරත්නම් (සාමාජික), ආර්.එම්.ඩබ්.එස්. සමරදිවාකර (සාමාජක)
කමල් පද්මසිරි මහතා (සාමාජික)

ගෝලීය සංචාරක කර්මාන්තය පිළිබඳව දළ විග්‍රහයක්

2017 වර්ෂයේ දී අන්තර්ජාතික සංචාරක පැමිණීම් 7% කින් වැඩි වී මුළු සංචාරක පැමිණීම මිලියන 1323 ක් බවට පත් වී ඇති බව දත්ත මගින් අනාවරණය වේ. මෙම වර්ධනය 2010 වසරේ සිට නිරීක්ෂණය කළ හැකි වූ 4% හෝ එයට වඩා ඉහළ වර්ධන අනුපාත ද ඉක්මවා යන අතර අවසාන වසර හත තුළ ලබා ගත් ඉහළම ප්‍රතිඵල මෙමගින් නිරූපණය වේ. අන්තර්ජාතික සංචාරක පැමිණීම්වලින් තක්සේරු කරන ලද ගෝලීය මට්ටමේ සංචාරක අංශයේ වර්ධනය 2018 වර්ෂයේ දී ද 4% - 5% අනුපාතයෙන්ම අඛණ්ඩව පවත්වාගෙන යෑමට අරමුණු කරනු ඇත.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂවරු සහ අංශ ප්‍රධානීන්

වමේ සිට දකුණට:

පළමුවන පේළිය: එම්.ඒ. ලියනාරච්චි මහතා (අධ්‍යක්ෂක ජනරාල්), සිසු ගෝමස් මහතා (සභාපති), තරංග රූපසිංහ මහතා (අධ්‍යක්ෂක මානව සම්පත් හා පරිශ්‍රය කළමනාකරණ)

දෙවන පේළිය: දයාන වික්‍රමසිංහ මහතා (අධ්‍යක්ෂක තොරතුරු හා තාක්ෂණ), වන්දන විජේරත්න මහත්මිය (නීති නිළධාරිණී), කේ.එම්. නසීම් මහතා (අභ්‍යන්තර විගණක), භාග්‍ය මහිමානන්ද මහතා (අධ්‍යක්ෂක නිර්මාණ පාලන), සම්පත් ගනේපලආරච්චි (අධ්‍යක්ෂක මූල්‍ය කළමනාකරණ)

ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය පිළිබඳ දළ විශ්ලේෂණයක්



1 වන වගුව : සංචාරක පැමිණීම් 2012 - 2017

2017 වසරේ දී ශ්‍රී ලංකාවට සංචාරකයන් 2,116,407 දෙනෙකු පැමිණි අතර 2016 වර්ෂයේ සංචාරක පැමිණීම් සංඛ්‍යාව වූ 2,050,832 ට සාපේක්ෂව මෙය සියයට 32 ක වර්ධනයක් විය.



2 වන වගුව : මාසයට අනුව සංචාරක පැමිණීම්

ප්‍රස්ථාරයේ දක්වා ඇති පරිදි, 2017 වර්ෂයේ වැඩිම සංචාරකයන් සංඛ්‍යාවක් පැමිණ ඇත්තේ ජනවාරි, පෙබරවාරි, ජූලි සහ දෙසැම්බර් මාසවලදීය. ඒ අතරින් ද, වැඩිම සංචාරකයන් පිරිසක් පැමිණ ඇත්තේ දෙසැම්බර් මාසයේය.



3 වන වගුව: විදේශ විනිමය ඉපයීම් (ඇ.ඩො. මිලියනවලින්)

පූර්ව වර්ෂයේ සංචාරක කර්මාන්තයෙන් ලැබූ මුළු ලැබීම් ප්‍රමාණය වූ ඇ.ඩො. මිලියන 3518.5 ට සාපේක්ෂව 11.5% ක වර්ධනයක් වාර්තා කරමින් 2017 වර්ෂයේ සංචාරක කර්මාන්තයෙන් ලබා ගත් මුළු ලැබීම් ප්‍රමාණය ඇ.ඩො. මිලියන 3924.9 ක් විය.



4 වන වගුව: 2017 වර්ෂයේ වැඩිම සංචාරක පැමිණීම් වාර්තා වූ වෙළඳපොළ 10

සංචාරක කර්මාන්තය සම්බන්ධයෙන් ප්‍රධාන කලාපීය ප්‍රභව වෙළඳපොළ පිළිබඳ විශ්ලේෂණයක් තුළින් වැඩිම අන්තර්ජාතික සංචාරක පැමිණීම් ප්‍රමාණය ඉන්දියාවෙන් වාර්තා වන බව අනාවරණය කර ගත හැකි විය. 2017 වර්ෂය තුළ, 12.7% ක අන්තර්ජාතික සංචාරක පැමිණීම් කොටසක් සහිතව චීනය දෙවන ප්‍රධාන වෙළඳපොළ බවට පත් වී ඇත. අප දිවයින වෙත පැමිණෙන මුළු සංචාරක පැමිණීම්වලින් තුනෙන් එකකට ආසන්න සංඛ්‍යාවක් සංචාරක කර්මාන්තයේ විශාලතම නිෂ්පාදකයන් වන ඉන්දියාව සහ චීනය වෙතින් පැමිණෙන සංචාරකයන් වේ.

2017 වර්ෂයේ ලබා ගත් ජයග්‍රහණ

8.1 සංචාරක කර්මාන්තය සඳහා අගය එකතු කිරීම

පර්යේෂණ සහ ජාත්‍යන්තර සම්බන්ධතා අංශය මගින් සංචාරක කර්මාන්තයට අදාළ ගුණාත්මක සහ ප්‍රමාණාත්මක දත්තවලට අදාළ සවිස්තරාත්මක ප්‍රකාශන විධිමත්ව ප්‍රකාශයට පත් කරනු ලැබීය.

සංචාරක පැමිණීම්, විදේශ විනිමය ඉපයීම්, රැකියා අවස්ථා ඇති කිරීම, හෝටල්වල අමුත්තන් නවාතැන් ලබා ගැනීමේ අනුපාතය, සංචාරය කිරීමේ ආකාර සහ සංචාරකයන්ගේ හැසිරීම, සංචාරකයන්ගේ ආකර්ෂණය දිනා ගත් ස්ථාන, පහසුකම් සහ භාවිත කරන ලද සේවා, සංචාරක ව්‍යාපෘති යන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තයේ කාර්යසාධනය දැක්වෙන මාසික සංඛ්‍යාලේඛන වාර්තාව, වාර්ෂික සංඛ්‍යාලේඛන වාර්තාව සහ විදේශීය සංචාරකයන් ශ්‍රී ලංකාවෙන් පිටව යෑම පිළිබඳව සිදු කළ සමීක්ෂණයේ වාර්තාව මේ ආකාරයෙන් විධිමත්ව ප්‍රකාශයට පත් කළ ඇතැම් ප්‍රකාශන වේ.



මාසික සංඛ්‍යාලේඛන වාර්තාව



වාර්ෂික සංඛ්‍යාලේඛන වාර්තාව 2016



විදේශීය සංචාරකයන් ශ්‍රී ලංකාවෙන් පිටව යෑම පිළිබඳව සිදු කළ සමීක්ෂණයේ වාර්තාව

8.1.1 විදේශීය සංචාරකයන් ශ්‍රී ලංකාවෙන් පිටව යෑම පිළිබඳව සමීක්ෂණයක් සිදු කිරීමේ අරමුණු වන්නේ,

- ශ්‍රී ලංකාවෙන් බැහැරව යන විදේශීය සංචාරකයන් පිළිබඳව ඔවුන්ගේ පෞද්ගලික පසුබිම් තොරතුරු මත පාදක වෙමින් සවිස්තරාත්මක ආකෘතියක් ගොඩනැංවීම.
- ගුණාත්මක සහ ප්‍රමාණාත්මක දත්ත යන දෙවර්ගයේම අතිරේක තොරතුරුවලින් සංචාරක කර්මාන්තයේ සංඛ්‍යාලේඛන පදනම ශක්තිමත් කිරීම.
- වර්තමාන සහ භවිෂ්‍ය සංචාරක පැමිණීම්වලට බලපෑම් සිදු කරන සාධක හඳුනා ගැනීම.
- කර්මාන්තයේ ක්‍රමෝපායන තීරණ ගැනීම සඳහා රාජ්‍ය සහ පුද්ගලික අංශවලට තොරතුරු ලබා ගැනීමට සැලැස්වීම සහ අනාගත සංචාරකයින්ගේ පැමිණීමට දායකවන ප්‍රධාන කරුණු හඳුනා ගැනීම.



8.1.2 ආයෝජන සම්බන්ධතා ඒකකය (IRU)

සංචාරක කර්මාන්තයේ ජාතික ආයෝජන සඳහා වූ ඒකකය හෝ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සියලු සේවා ලබා දීමේ ඒකකය ලෙස පූර්වයෙන් හඳුන්වන ලද ආයෝජන සම්බන්ධතා ඒකකය (IRU) මගින් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්ත ව්‍යාපෘති සංවර්ධනය කිරීම සඳහා තොරතුරු ලබා ගැනීමට අපේක්ෂා කරන විදේශීය සහ දේශීය ආයෝජකයන් සඳහා ද, පළාත් සහ පළාත් පාලන ආයතන සහ උපයෝගී සේවා සපයන්නන් ආදිය ද ඇතුළත්ව නියාමන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, නියෝජිතායතන සහ අදාළ පාර්ශ්වකරුවන් ආදී ආයතනවලින් ලබා ගත යුතු විවිධාකාර අනුමතීන් ලබා ගැනීම සඳහා ද අවශ්‍ය වන මධ්‍යගත පහසුකම් සපයයි.

ආයෝජන සම්බන්ධතා ඒකකය (IRU) ස්ථාපනය කිරීමේ මූලික අරමුණ වන්නේ සංචාරක කර්මාන්ත ව්‍යාපෘති අනුමත කිරීමේ ක්‍රියාවලිය සඳහා පහසුකම් සැලසීම සහ දිවයිනේ සංචාරක කර්මාන්ත ආයෝජන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීම සඳහා ගත වන කාලය අඩු කිරීම මගින් ආයෝජකයාට මුහුණ පෑමට සිදු වන ගැටළු අවම කිරීමයි. ආයෝජන සම්බන්ධතා ඒකකය (IRU) ස්ථාපනය කිරීම සාර්ථක මූලාරම්භයක් වුව ද, වඩාත් සරල කරන ලද ආයෝජන අනුමත කිරීමේ ක්‍රියාවලියක් හඳුන්වා දීම මගින් ආයෝජන සම්බන්ධතා ඒකකයේ (IRU) කාර්යසාධනය තවදුරටත් වැඩි දියුණු කළ හැකිය.

අන්තර්ජාතික සංවර්ධනය උදෙසා එක්සත් ජනපද නියෝජිතායතනයේ (USAID) ශ්‍රී ලංකාවේ ආයෝජන කඩිනම් කිරීමට සහාය ලබා දීමේ (SAIL) ව්‍යාපෘතිය ආයෝජන සම්බන්ධතා ඒකකයේ (IRU) ආයෝජන අනුමත කිරීමේ ක්‍රියාවලිය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා සහාය ලබා දීමට ඉදිරිපත් විය. ශ්‍රී ලංකාවේ ආයෝජන කඩිනම් කිරීමට සහාය ලබා දීමේ (SAIL) ව්‍යාපෘතිය මගින් ආයෝජන සම්බන්ධතා ඒකකයේ (IRU) සහ වෙනත් රේඛීය නියෝජිතායතන / පාර්ශ්වකරුවන් අතර අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීමට යෝජනා කරන ලදී.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) ශ්‍රී ලංකාවේ ආයෝජන කඩිනම් කිරීමට සහාය ලබා දීමේ (SAIL) ව්‍යාපෘතිය සමඟ එක්ව නාගරික සංවර්ධන අධිකාරියේ (UDA) දැනට පවතින අනුමත කිරීමේ ක්‍රියාවලිය අනුරූපණය කිරීමේ කටයුතු ආරම්භ කරන ලද අතර 2017 වසරේ ඒ ඒ අනුමත කිරීමේ ක්‍රියාවලිය සඳහා එකඟතාවට එළැඹී කාලසීමාවට අනුව කෙටුම්පත් අවබෝධතා ගිවිසුමක් පිළියෙළ කරන ලදී. අනෙකුත් සියලුම රේඛීය නියෝජිතායතන අතර ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය ද මෙයට සමානව අඛණ්ඩව සිදු කරනු ඇත.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) 2020 වසරේදී සංචාරක පැමිණීම් මිලියන 4ක් වාර්තා කිරීමට අරමුණු කරන අතර සංචාරක ආර්ථිකය සඳහා සේවා සපයන හෝටල්වල කාමර 70,000 - 80,000 ක් පමණ මේ සඳහා අවශ්‍ය වනු ඇත. නව ආයෝජන ව්‍යාපෘති තුළින් ජාතික කාමර ධාරිතාවට නව කාමර එකතු කිරීම මගින් ආයෝජන සම්බන්ධතා ඒකකය (IRU) මෙම අභිමතාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා ධනාත්මක දායකත්වයක් ලබාදේ.

පසුගිය වර්ෂ දෙකට සාපේක්ෂව, ජාතික කාමර ධාරිතාව ඉහළ නැංවීම සඳහා ආයෝජන සම්බන්ධතා ඒකකයේ (IRU) දායකත්වය මගින් සැලකිය යුතු වර්ධනයක් සිදු වී ඇති අතර ඉදිරි වර්ෂ දෙකක කාලය තුළ ජාතික කාමර ධාරිතාව කැපී පෙනෙන පරිදි වර්ධනය කිරීමට ආයෝජන සම්බන්ධතා ඒකකය (IRU) අරමුණු කර ඇත.

ආයෝජන සම්බන්ධතා ඒකකය (IRU) මගින් පහසුකම් ලබා දී ඇති වර්තමානයේ දී ඉදි කිරීමේ අදියර යටතේ පවතින හෝටල් ආයෝජන ව්‍යාපෘති පිළිබඳ සංඛ්‍යාලේඛනවලට අනුව, 2017 සිට 2020 දක්වා කාල පරිච්ඡේදය තුළ නව හෝටල් කාමර 7493 ක් වෙළඳපොළට එකතු වීමට නියමිතව පවතින අතර මීළඟ දෙවසරක කාල පරිච්ඡේදය තුළ ආයෝජන සම්බන්ධතා ඒකකය (IRU) වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි නව ව්‍යාපෘති සමඟ මෙම කාමර සංඛ්‍යාව තවදුරටත් ඉහළ නඟිනු ඇත. ආයෝජන සම්බන්ධතා ඒකකය (IRU) මගින් 2010 සිට 2017 දක්වා වූ කාල පරිච්ඡේදය තුළ සමස්තයක් වශයෙන් අනුමත කළ ව්‍යාපෘති සංඛ්‍යාව වූ 307 ට සාපේක්ෂව 2017 වර්ෂයේ දී ව්‍යාපෘති 45 ක් අනුමත කරන ලදී.

මෙම අනුමත කළ ව්‍යාපෘතිවල ආයෝජනය ඇමෙරිකානු ඩොලර් මිලියන 380 ක් වන අතර එම ව්‍යාපෘතිවල භූගෝලීය පිහිටීම් පහත දක්වා ඇති පරිදි වේ.

2017 වර්ෂයේ දී අවසාන අනුමති ලබා දුන් ව්‍යාපෘති

දිස්ත්‍රික්ක	2017 වර්ෂයේ දී ලබා දුන් අවසාන අනුමැති		
	ව්‍යාපෘති සංඛ්‍යාව	කාමර	ආයෝජනය
අම්පාර	1	16	0.63
අනුරාධපුරය	1	17	0.33
බදුල්ල	4	183	7.50
කොළඹ	4	928	200.38
ගාල්ල	8	514	40.26
ගම්පහ	2	72	4.03
හම්බන්තොට	4	65	15.79
යාපනය	3	46	51.33
කළුතර	4	102	5.77
මහනුවර	2	34	2.15
කෑගල්ල	1	50	3.90
මාතලේ	1	18	0.34
මාතර	3	250	41.57
පුත්තලම	3	40	1.43
ත්‍රිකුණාමලය	3	53	4.33
රත්නපුරය	1	5	0.03
එකතුව	**45**	**2393**	**379.77**

5 වන වගුව: 2017 වර්ෂයේ දී අවසාන අනුමති ලබා දුන් ව්‍යාපෘති

2017 වර්ෂයේ දෙසැම්බර් මාසයේ 31 දින දක්වා අනුමත කළ ව්‍යාපෘති 307 අතරින් මේ වන තෙක් ඉදිකිරීම් කටයුතු සිදු කෙරෙමින් පවතින ව්‍යාපෘති පිළිබඳ විස්තර ඉහත දක්වා ඇත.

දිස්ත්‍රික්ක	ව්‍යාපෘති සංඛ්‍යාව	කාමර	ආයෝජනය
අම්පාර	1	10	0.58
මඩකලපුව	3	74	11.13
බදුල්ල	5	203	11.6
කොළඹ	18	3247	919.68
ගාල්ල	17	1084	96.732
ගම්පහ	6	569	57.5
හම්බන්තොට	9	292	62.575
යාපනය	3	106	106
කළුතර	10	584	96.002
මහනුවර	4	58	3.984
කෑගල්ල	1	50	3.9
මාතලේ	3	126	5.963
මාතර	8	239	19.451
නුවරඑළිය	4	476	54.16
පුත්තලම	3	117	7.39
ත්‍රිකුණාමලය	7	170	21.68
මන්නාරම	1	52	52
වවුනියාව	2	36	5.09
එකතුව	**105**	**7493**	**1360.152**

6 වන වගුව: 2017 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් කටයුතු සිදු කෙරෙමින් පවතින ව්‍යාපෘති

2017 දෙසැම්බර් 31 දිනට අවසාන අනුමැතිය ලබා දුන් ව්‍යාපෘතිවල ඉදිකිරීම් අදියර



7 වන වගුව: 2016 වසරේ ඉදිකිරීම් අදියරේ පැවති ව්‍යාපෘති

2017 වර්ෂයේ දෙසැම්බර් මාසයේ 31 දින වන විට සම්පූර්ණ ව්‍යාපෘති 307 අතරින් ව්‍යාපෘති 157 ක මුළු සංඛ්‍යාවක් අනුමත කර ඇති අතර එම ව්‍යාපෘති මෙහෙයුම් අදියරේ පවතී. එකතු කළ කාමර සංඛ්‍යාව 8,182 ක් වන අතර අනුමත කළ ව්‍යාපෘති 307 ට අදාළව ඒවායේ ඉදිකිරීමේ අදියර ඉහත දැක්වේ.

8.2 නිවාඩු නිකේතන කළමනාකරණය සහ සංවර්ධනය

නිවාඩු නිකේතන කළමනාකරණ අංශය වෙළඳ නිවාඩු නිකේතන 04 ක්, වෙළඳ නොවන නිවාඩු නිකේතන 02 ක් මෙහෙයවීම සහ කළමනාකරණය කිරීම සිදු කරයි. එමෙන්ම, මෙම අංශය පුද්ගලික අංශයේ තනි පුද්ගලයන් සඳහා බදු දී ඇති අමුත්තන්ගේ නිවාස (රාජ්‍ය පරිපාලන අමුත්තන්ගේ නිවාස) 37 ක ප්‍රමිතිය පාලනය කිරීමේ ද නියැලී සිටියි.

8.2.1 වෙළඳ නිවාඩු නිකේතන

නුවරඑළිය, බණ්ඩාරවෙල කතරගම සහ අනුරාධපුරයේ පිහිටි ජාතික නිවාඩු නිකේතන දිවයිනේ මනස්කාන්ත ස්ථානවල පිහිටි වෙළඳ නිවාඩු නිකේතන 04 වේ. විශේෂයෙන්ම දේශීය සංචාරකයන් සඳහා දූරිය හැකි මිලකට ආහාරපාන ද ඇතුළත්ව මෙම නිවාඩු නිකේතනවල නවාතැන් පහසුකම් සපයනු ලැබේ.

පසුගිය කාල පරිච්ඡේදය තුළ, අමුත්තන්ගේ තෘප්තියට හේතු වන පරිදි අළුත්වැඩියා කිරීමේ වැඩසටහන් පැවැත්වීම, ජෙනරේටර් සවි කිරීම සහ උසස් තත්ත්වයේ ඇඳ ඇතිරිලි, මේස රෙදි ආදිය සහ ගෘහ භාණ්ඩ සැපයීම මගින් මෙම නිවාඩු නිකේතනවල තත්ත්වය ඉහළ නැංවීම සහ වැඩි දියුණු කිරීම සිදු කරන ලද අතර ඉහත දක්වා ඇති කරුණුවලට අමතරව, දිවයිනේ දේශීය සංචාරකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා දෛනිකව ඉටු කළ යුතු නඩත්තු කටයුතු ද සම්පූර්ණ කරන ලදී.

බණ්ඩාරවෙල ජාතික නිවාඩු නිකේතනය - දළ වශයෙන් රු. මිලියන 4.0 ක් වැය කරන ලදී.
නුවරඑළිය ජාතික නිවාඩු නිකේතනය - දළ වශයෙන් රු. මිලියන 4.5 ක් වැය කරන ලදී.
කතරගම ජාතික නිවාඩු නිකේතනය - දළ වශයෙන් රු. මිලියන 1.5 ක් වැය කරන ලදී.
අනුරාධපුරය ජාතික නිවාඩු නිකේතනය - දළ වශයෙන් රු. මිලියන 1.6 ක් වැය කරන ලදී.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) පහත දක්වා ඇති කටයුතු සම්පූර්ණ කර ඇත.

අනුරාධපුරයේ අමුත්තන්ගේ කාමර 13 ක් අළුත්වැඩියා කිරීම	රු. මිලියන 21
කතරගම නව මළාපවහන මාර්ගය ඇතිරීම	රු. මිලියන 5
අනුරාධපුරයේ අමුත්තන්ගේ කාමර 16 ක් අළුතින් ඉදිකිරීම	45% ක් සම්පූර්ණ කර ඇත

8 වන වගුව: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) මගින් සම්පූර්ණ කරන ලද කටයුතු

8.2.2 වෙළඳ නොවන නිවාඩු නිකේතන

ජාතික නිවාඩු නිකේතනය පාසිකුඩා
පාසිකුඩා ප්‍රදේශයේ පිහිටි වෙළඳ නොවන ජාතික නිවාඩු නිකේතනය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් 2010 සවිස්තරාත්මක ප්‍රධාන සැලසුම අනුගමනය කරනු ලැබේ. මඩකලපුව දිස්ත්‍රික්කයේ නැගෙනහිර වෙරළ තීරයට සංචාරකයන් ආකර්ෂණය කිරීම සඳහා 2010 වසරේ දී, පාසිකුඩා ප්‍රදේශයේ පිහිටි වෙළඳ නොවන ජාතික නිවාඩු නිකේතනය සංවර්ධනය කිරීම සඳහා සවිස්තරාත්මක ප්‍රධාන සැලසුම ද පිළියෙළ කර අවසන් කරන ලදී.

පාසිකුඩා ප්‍රදේශයේ පිහිටි වෙළඳ නොවන ජාතික නිවාඩු නිකේතනයේ හෝටල් ඉදි කිරීම සඳහා පුද්ගලික අංශයට ඉඩම් කැබලි 14 ක් බදු දී ඇත. මෙම ඉඩම් කැබලි 14 න් 12 ක හෝටල් ඉදි කිරීම අවසන් කර ඇති අතර එම හෝටල් මෙහෙයුම් අදියරේ පවතී. පාසිකුඩා ප්‍රදේශයේ පිහිටි වෙළඳ නොවන ජාතික නිවාඩු නිකේතනය කාර්යක්ෂමව සහ සඵලදායීව මෙහෙයවීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) මගින් විදුලිය, ජලය සහ මළාපවහන ප්‍රතිකාරක කම්හල ආදී මූලික යටිතල පහසුකම් සපයන ලදී. හෝටල්වල මෙහෙයුම් කටයුතු සිදුවීමත් සමඟ නැගෙනහිර වෙරළාශ්‍රිත ප්‍රජාව වෙත ඍජු සහ වක්‍ර ප්‍රතිලාභ ලැබී තිබුණි.

වර්තමානයේ දී පුද්ගලික අංශය වෙත ඉඩම් කැබලි 14 ක් බදු දී ඇති අතර හෝටල් 12 ක් ඒවායේ මෙහෙයුම් අදියරේ පවතී. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) මගින් විදුලිය, ජලය සහ මළාපවහන ප්‍රතිකාරක කම්හල ආදී මූලික යටිතල පහසුකම් සපයන ලදී. 2016 වසරේ පාසිකුඩා වෙළඳ නොවන ජාතික නිවාඩු නිකේතනය සඳහා සිදු කළ ආයෝජනය පහත ශ්‍රී ලංකා රුපියල් මිලියන 180.5 ක් වූ අතර එම ආයෝජන ප්‍රමාණය පහත දක්වා ඇති ආකාරයෙන් ප්‍රභේදනය කළ හැකිය.

- විදි ලාම්පු 210 ක් සැලසුම් කිරීම සහ ඉදිකිරීම සඳහා රු. මිලියන 46 ක් වැය කිරීම.
- ප්‍රධාන ප්‍රවේශ මාර්ගයේ ii අදියර සැලසුම් කිරීම සහ ඉදිකිරීම සඳහා රු. මිලියන 20 ක් වැය කිරීම.
- ජල පවිත්‍රකරණය සඳහා රු. මිලියන 100 ක් වැය කිරීම.
- භූගත ජල පොම්පාගාරය සහ ආරක්ෂක කුටිය ඉදි කිරීම සඳහා රු. මිලියන 14.5 ක් වැය කිරීම.

බෙන්තොට පිහිටි වෙළඳ නොවන නිවාඩු නිකේතනය මගින් හෝටල්කරුවන්ට පොදු මළාපවහන ප්‍රතිකාරක පහසුකම සහ ජල සැපයුම ලබා දෙයි. එයට අමතරව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) මගින් නිවාඩු නිකේතනය සඳහා සමස්ත ආරක්ෂාව සහ පවිත්‍ර කිරීමේ සේවා සපයයි. සුලංකා බංගලාව නැවත සකස් කිරීමේ කටයුතු සඳහා කොන්ත්‍රාත් කටයුතු ආරම්භ කරන ලද අතර නැවත සකස් කිරීමේ කටයුතුවලින් දළ වශයෙන් 35% ක් වසර අවසානයේ දී සම්පූර්ණ කිරීමට හැකියාව ලැබී තිබුණි.

8.2.3 නිවාඩු නිකේතන සංවර්ධනය කිරීම

කල්පිටිය
කල්පිටිය නිෂ්පාදන සංවර්ධනය අක්‍රියාකාරී තත්ත්වයක පවතී. පොදු යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම සහ ප්‍රවේශ වීමේ අපහසුව හව්‍ය ආයෝජකයන් සඳහා පවතින පොදු ගැටළුවයි. සංචාරක කර්මාන්ත සංවර්ධනය ප්‍රධානම ප්‍රමුඛතාව නොවන වෙනත් අමාත්‍යාංශ සහ බලාධිකාරීන් වෙත මෙම දුෂ්කරතා සඳහා විසඳුම් ලබා දීමේ වගකීම පොදුවේ බෙදී යෑම හේතුවෙන් මෙම ගැටළුවලට මේ වන තෙක් විසඳුම් ලබා දීමට නොහැකි වී ඇත.

පාරිසරික වශයෙන් සංවේදී "මුහුදු පදනම් කර ගත් දූපත් නිවාඩු නිකේතනය" යන නව නිෂ්පාදනය ශ්‍රී ලංකාවේ ස්ථාපනය කිරීම ඉලක්ක කර ගත් සමෝධානික (Integrated) සංචාරක කර්මාන්ත නිවාඩු නිකේතනයක් වශයෙන් කල්පිටිය 2014 වර්ෂයේ දී මුලින්ම සංකල්පීකරණය කරන ලදී.

පළමු අදියරේ දී, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය දූපත් 12 ක් පවරා ගන්නා ලද අතර ක්‍රමෝපායික පාරිසරික අධ්‍යනය සමඟ ප්‍රධාන සංවර්ධන සැලැස්මක් වැඩි දියුණු කරන ලදී.

ලන්දේසි බොක්ක, පෘතුගීසි බොක්ක සහ කරෙයිතිවු, ඉප්පන්තිවු, පෙරියරාච්චි, ඉරමතිව්, සින්නරාරච්චියල්, ඔඩ්ඩකරෙල්තිවු, බත්තලන්ගුන්ඩුව, පල්ලියවත්ත සහ වෙල්ලෙයි යනාදී අතිශයින්ම ආකර්ෂණීය දූපත් 9 කින් මෙම නිවාඩු නිකේතනය සමන්විත වේ.

සමස්ත සංවර්ධන ප්‍රදේශය අක්කර 5000 ක් ලෙස සැලකෙන අතර මෙම නිවාඩු නිකේතනය කාමර 4000

කින් සමන්විත වේ. මෙමගින් ඍජු රැකියා අවස්ථා 16000 ක් උත්පාදනය වනු ඇත. මෙම නිවාඩු නිකේතනය සංවර්ධනය කරනු ලබන තැනැත්තා වෙත ඇමෙරිකානු ඩොලර් මිලියන 175 ක ආදායම් උපයා ගැනීමේ අවස්ථාවක් ද හිමි වනු ඇත. (රාත්‍රී කාලය සඳහා එක් කාමරයක් සඳහා ඇමෙරිකානු ඩොලර් 175 ක් බැගින් 80% ක අනුපාතයකින් කාමරවල නවාතැන් ගැනීම මගින්) රජයේ ප්‍රතිපත්තිවල වෙනස්වීම් හේතුවෙන්, 2010 වර්ෂයේ දී ආර්ථික කටයුතු අමාත්‍යාංශය මගින් ක්‍රියාවලිය අවලංගු කිරීමත් සමඟ අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා දීම සඳහා තෝරා ගත් මුල් සමාගම් 14 අතරින් සමාගම් දෙකක් පමණක් ඉදිරි කටයුතු අඛණ්ඩව සිදු කිරීමට කැමැත්ත දක්වා තිබේ.

විවිධ හේතු මත සමස්තයක් වශයෙන් යෝජනා දෙකක් සඳහා අනුමතිය අපේක්ෂා කෙරේ. පළමුව, Sun Resort Lanka (Pvt) Ltd වෙල්ලෙයි දූපතට ඉවතින් ජල බංගලා ඉදි කිරීමට කැමැත්තෙන් සිටින අතර මේ සඳහා මුහුදු පතුල බදු දීම අවශ්‍ය වී තිබේ. මෙවැනි බදු දීමක් ශ්‍රී ලංකාවේ මෙතෙක් සිදු කර නොමැති අතර මුහුදු පතුල බදු දීමේ කටයුතු කල්පිටියේ ප්‍රාදේශීය ලේකම්වරයා වෙත ඉදිරිපත් කර තිබේ.

දෙවනුව "Qube Lanka Leisure (Pvt) Ltd" ඉපැන්ටිව් දූපත මත ඉදි කිරීම් සිදු කිරීමට කැමැත්තෙන් සිටින අතර ඔවුන් මේ දක්වා බදු කුලිය වසර 08 කට අධික කාලයක් මුළුල්ලේ අඛණ්ඩව ගෙවනු ලබයි. විකල්ප ස්ථානයකට යෑමට අකමැත්තෙන් පසු වන මෙම සමයේ දූපතේ කොටසක පදිංචිව සිටින ධීවර ප්‍රජාව හේතුකොටගෙන සැලකිය යුතු ගැටළුවක් මේ වන විට නිර්මාණය වී තිබේ.

කුච්චවේලි
කුච්චවේලි සංවර්ධන කටයුතු අක්‍රියාකාරී තත්ත්වයක පවතී. පූර්ව බදු ගෙවීම් සඳහා ඉහළ මිලක් ගෙවිය යුතු වන බව හව්‍ය ආයෝජකයන් විසින් සිදු කරන පොදු පැමිණිල්ලක් බවට පත් වී ඇත. ත්‍රිකුණාමලයට ආසන්න නැගෙනහර වෙරළේ වෙරළබඳ නිවාඩු නිකේතනයක් වශයෙන් කුච්චවේලි දූපත 2010 වසරේදී පළමුව සංකල්පීකරණය කරන ලදී. ඉරක්කන්ඩි සහ සලපයාරු පාලම් අතර පිහිටා ඇති වෙරළ ඉදිරියේ ඇති ඉඩම් අක්කර 510 කින් මෙම ව්‍යාපෘතිය සමන්විත වේ.

මෙම ස්ථානයේ වඩාත් සුදුසු මාර්ගයක්, විදුලිය සහ ජලය පවතී. මෙම ව්‍යාපාතිය මගින් කාමර 3500 ක් ස්ථාපනය කිරීමට සහ රැකියා අවස්ථා 14,000 ක් උත්පාදනය කිරීමට ද, ඇමෙරිකානු ඩොලර් මිලියන 150 ක ආදායමක් ලබා ගැනීමට ද අපේක්ෂා කෙරේ. (රාත්‍රී කාලය සඳහා එක් කාමරයක් සඳහා ඇමෙරිකානු ඩොලර් 150 ක් බැගින් 80% ක අනුපාතයකින් කාමරවල නවාතැන් ගැනීම මගින්)

කෙසේ වුවද, ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගුවන් තොටුපළේ සිට මහා මාර්ගය ඔස්සේ ත්‍රිකුණාමලයට ළඟා වීමට පැය 08 ක කාලයක් ගත වීම ආයෝජනය කිරීමකට අනුබල නොදෙන තරම් සුවිශේෂී තත්ත්වයකි. පුද්ගලික අංශයට අයත් ගුවන් සමාගම් මගින් දේශීය ගුවන් යානා මෙහෙයුම් කටයුතු සිදු කිරීමේ හවයක් ද පවතී. අක්කර 01 ක ඉඩමක් සඳහා තථ්‍ය වටිනාකමට වඩා ඉහළ මිලක් ගෙවීමට සිදු වීමක් ලෙස හව්‍ය ආයෝජකයන් සලකන ශ්‍රී ලංකා රුපියල් මිලියන 20 ක පූර්ව බදු ගෙවීම් කිරීමේ අවශ්‍යතාවක් පැවතීම හව්‍ය ආයෝජකයන් මේ සම්බන්ධයෙන් සිදු කරන ප්‍රධාන පැමිණිල්ල බවට පත්ව ඇත.

කෙසේ වුවද, Uga Escapes Management (Pvt) Ltd. මගින් වඩාත් සුඛෝපභෝගී පහසුකමක් වශයෙන් මෙම ස්ථානයේ මෙහෙයවනු ලබන එකම නිවාඩු නිකේතන මෙහෙයුම්කරු වන Jungle Beach Resort ආයතනයේ පහසුකම් සහ සේවා මාස 3 කට පූර්වයෙන් සම්පූර්ණයෙන්ම වෙන් කර අවසන්ව තිබෙන බව ප්‍රතිසංවාදීය කරුණක් වශයෙන් අවධාරණය කළ යුතු වේ.

විවිධ අවහිරතා අවබෝධ කර ගැනීම සඳහා මෙන්ම වර්තමාන සංදර්භය තුළ මෙම ගැටළු විසඳා ගැනීම සඳහා ද, අග්‍රාමාත්‍යතුමාගේ කාර්යාලයේ සමාරම්භකයක් යටතේ මහාචාර්ය මැටි ඇන්ඩෘස් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හාවර්ඩ් විශ්වවිද්‍යාලයේ අන්තර්ජාතික සංවර්ධනය පිළිබඳ මධ්‍යස්ථානයේ (CID) විශේෂඥ කණ්ඩායමක් සමඟ 2016 අගෝස්තු මාසයේ දී ව්‍යාපාතියක් ආරම්භ කරන ලදී.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ (SLTDA) නිලධාරීන් සමඟ හාවර්ඩ් විශ්ව විද්‍යාලයේ පහසුකම් සපයන්නන්ගෙන් මෙම කණ්ඩායම සමන්විත වූ අතර එය 2017 වසරේ මධ්‍ය භාගය දක්වා පවත්වාගෙන යන ලදී. ප්‍රජාව සඳහා ආදායම් මාර්ග උත්පාදනය වන අතර මෙම නිවාඩු නිකේතනයට පැමිණෙන සංචාරකයන් සඳහා ඍජු අත්දැකීම් ලබා දීමක් වශයෙන් තේමා ගම්මාන තුනක් (ධීවර ගම්මානය, අත්කම් ගම්මානය සහ කෘෂි ගම්මානය) ඇතුළත් කරමින් කුච්චවේලි හරිත සමෝධානික නිවාඩු නිකේතනය සඳහා සංකල්පිත සැලැස්මක් පිළියෙළ කරන ලදී.

යාල වනජීවී නිවාඩු නිකේතනය (YWR)
යාල වනජීවී නිවාඩු නිකේතනයේ (YWR) සැලකිය යුතු ප්‍රගතියක් සහ සංවර්ධනයක් ඇති වී තිබේ. නිවාඩු නිකේතනයේ උතුරු කොටසේ නව අධිශක්මතා (High Tension) විදුලි සැපයුමක් ස්ථාපනය කර ඇති අතර උතුරු කොටසේ ප්‍රවේශ වීමේ පොදු මාර්ගය ද සම්පූර්ණ කර ඇත.

Uga Escapes Management (Pvt) Ltd මගින් පාලනය වන Chena huts ද, Wild Coast Lodge (Pvt) Ltd මගින් පාලනය වන Wild Coast Tented Lodge සමාගම ද වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කර ඇත.

වන සතුන් නැරඹීමට විශාල ඇල්මක් දක්වන පුද්ගලයන් සඳහා ඔවුන් වනජීවීන් අතර සිටීමින් වනජීවීන් නරඹනවා වැනි අත්දැකීමක් ලැබෙන ඉතා ඉහළ වටිනාකමක් ඇති සංචාරක සම්පතක් වශයෙන් යාල වනජීවී උද්‍යානය (YWR) සංකල්පීකරණය කර ඇත. මෙම නිවාඩු නිකේතනය යාල ජාතික උද්‍යානයට යාබදව පිහිටා ඇති අතර අවරෝධක කලාපයට සැතපුමක් පිටතින් ද පිහිටා ඇත.

වනජීවී උද්‍යානය සහ යාල වනජීවී උද්‍යානය (YWR) අතර වැටවල් හෝ වෙනත් වෙන් කිරීම් නොමැති බැවින්, සංචාරකයන් වනජීවීන් අතර සිටීමින් වනජීවීන් නරඹනවා වැනි අත්දැකීමක් ලැබේ. යාල වනජීවී උද්‍යානයේ (YWR) ආයෝජකයන් 07 දෙනා අතරින් Chena Huts සමාගම වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලද පළමු සමාගම වන අතර Wild Coast Tented Lodge සමාගම ද 2017 වර්ෂයේ දී එහි මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලදී.

ඉතිරි ව්‍යාපෘති දෙක ක්‍රියාත්මකව පවතී. R&R Company (Ltd) සහ Ascot Leisure (Pvt) Ltd. යන සමාගම් තවමත් ඉදි කිරීම් කටයුතු ආරම්භ කර නොමැත.

දෙද්දුව ලේක් රිසෝර්ට්
මෙම ව්‍යාපෘතිය එහි මුල් අදියරවල ක්‍රියාත්මක වෙමින් පවතින අතර අත්පත් කර ගැනීමට සැලසුම් කරන ලද අක්කර 1800 න් අක්කර 1732.03 ක් අත්පත් කර ගැනීමේ කටයුතු දැනට ක්‍රියාත්මකව පවතියි. මෙම දෙද්දුව ලේක් රිසෝර්ට් හි මායිම් වන්නේ ජෙෆ්රි බාවාගේ ලුණු ගඟ නිවාසය සහ දේපළ වේ. එය බෙන්තොට නැගෙනහිර පිහිටා ඇති අතර ජලාශ, වගුරු බිම් සහ අත්හැර දමන ලද කුඹුරුවලින් ද එය සමන්විත වේ.

මෙම ස්ථානය පාදක වන ලුණු ගඟ ඉඩම ආදර්ශ ඉඩමක් වශයෙන් සැලකිය හැකිය. මෙම ඉඩමේ අනාගත සංවර්ධන කටයුතු සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) දක්ෂිණ සංවර්ධන මණ්ඩලය සමඟ එක්ව සංකල්පිත සැලැස්මක් පිළියෙළ කර ඇත.

ඒ අනුව, ඉදිරි අනාගතයේ දී, මෙම ආකර්ෂණීය ඉඩම් කොටසේ ආයෝජනය කිරීම සඳහා පුද්ගලික අංශය වෙත ආයෝජන අවස්ථා උදා වනු ඇත.

8.2.4 සංචාරක කර්මාන්තය වැඩි දියුණු කිරීම සඳහා නව ඉඩම් හඳුනා ගැනීම

සංචාරක කර්මාන්තය වැඩි දියුණු කිරීම සඳහා පහත දැක්වෙන ඉඩම් හඳුනා ගනු ලබන අතර ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ (SLTDA) අධ්‍යක්ෂ මණ්ඩලය මගින් එම ඉඩම් අත්පත් කර ගැනීමේ / පැවරීමේ ක්‍රියාවලිය ඉදිරියට සිදු කරගෙන යෑම සඳහා අනුමතිය ලබා දී ඇත,

හඳුනාගන්නා ලද ඉඩම	ඉඩමේ ප්‍රමාණය අක්කරවලින් (දළ වශයෙන්)
අකුරල	493.00
බගවන්තලාව	316.00
වාලච්චේනයි	265.00
දෙනියාය	350.00
කොහිලවගුර	27.60
මුල්ලේරියාව, වැලිවිට (මාලඹේ අධිවේගී මාර්ගයේ පිටවීම)	36.00

9 වන වගුව: සංචාරක කර්මාන්තය වැඩි දියුණු කිරීම සඳහා නව ඉඩම් හඳුනා ගැනීම

8.3 ප්‍රමිති සහ තත්ත්ව ආරක්ෂණය

8.3.1 සංචාරක ආයතන ලියාපදිංචි කිරීම සහ බලපත්ලාභී සංචාරක ආයතන

සංචාරක ආයතන සහ සේවා සපයන්නන් ලියාපදිංචි කිරීම සහ බලපත් ලබා දීම ප්‍රමිති සහ තත්ත්ව ආරක්ෂණ අංශයේ ප්‍රධානම සහ වැදගත් කටයුත්තකි.

මේ සඳහා විධිමත් පරීක්ෂණ සිදු කරනු ලබයි. හෝටල්, අමුත්තන්ගේ නිවාස සහ ආපන ශාලා සඳහා මත්පැන් බලපත්‍ර ලබා දීම සඳහා සුරාබදු දෙපාර්තමේන්තුවට නිර්දේශ ඉදිරිපත් කිරීමට ද, සංචාරක විදේශීය කාර්ය මණ්ඩලවලට ශ්‍රී ලංකාවේ රැකියාවල නිරත වීම සඳහා වීසා ලබා දීම සඳහා ආගමන සහ විගමන දෙපාර්තමේන්තුවට නිර්දේශ ඉදිරිපත් කිරීමට ද ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) කටයුතු කරයි.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ (SLTDA) ලියාපදිංචි වී ඇති සංචාරක ආයතන සංඛ්‍යාව පහත දක්වා ඇත.

ප්‍රභේදය	2017.01.01 දින සිට 2017.12.31 දින දක්වා		ශ්‍රී.ල.සං.ස.අ. යේ ලියාපදිංචි වූ මුළු සංඛ්‍යාව	
	ඒකක	කාමර	ඒකක	කාමර
වර්ගීකරණය කළ සංචාරක හෝටලය	25	2,944	139	12,751
තරු පහේ	3	704	20	4,217
තරු හතරේ	2	294	18	2,092
තරු තුනේ	9	1,245	25	2,957
තරු දෙකේ	5	264	36	1,718
තරු එකේ	6	437	40	1,767
වර්ගීකරණය නොකළ සංචාරක හෝටල්	24	1,694	239	10,482
සුපිරි කුඩා හෝටල් (Boutique Hotel)	3	86	26	508
සුපිරි විලා (Boutique Villa)	3	15	35	224
ආගන්තුක නිවාස	47	699	884	9,549
නේවාසිකව නැවතී සිටීමේ ඒකකය	87	224	363	1,092
බංගලා	53	226	338	1,422
ඓතිහාසික බංගලා (Heritage Bungalow)	0	0	4	19
ඓතිහාසික නිවාස (Heritage Home)	1	1	2	8
සංචාරක මහල් නිවාස	9	31	61	176
සංචාරක ආගන්තුක නිවස	0	0	6	19
එකතුව	**252**	**5,920**	**2,097**	**36,250**

10 වන වගුව: නවාතැන් සැපයීමේ අංශය

ප්‍රභේදය	2017.01.01 දින සිට 2017.12.31 දින දක්වා	ශ්‍රී.ල.සං.ස.අ. යේ ලියාපදිංචි වූ මුළු සංඛ්‍යාව
අවන්හල්	31	469
සංචාරක නියෝජිත ආයතන	90	832
ස්පා සහ සුවතා මධ්‍යස්ථාන	18	58
සංචාරක සාප්පු	3	73
ජල ක්‍රීඩා මධ්‍යස්ථාන	8	25
කුළුබඩු උයන්	1	35
එකතුව	**151**	**1,492**

11 වන වගුව: සුවිශේෂී සංචාරක සේවා

ප්‍රභේදය	2017.01.01 දින සිට 2017.12.31 දින දක්වා	ශ්‍රී.ල.සං.ස.ඇ. යේ ලියාපදිංචි වූ මුළු සංඛ්‍යාව
ජාතික සංචාරක මාර්ගෝපදේශක	55	1,365
රථාචාර්ය සංචාරක මාර්ගෝපදේශක	59	1,135
ප්‍රාදේශීය සංචාරක මාර්ගෝපදේශක	15	526
පරිශ්‍රු සංචාරක මාර්ගෝපදේශක	0	89
එකතුව	**129**	**3,115**

12 වන වගුව: සංචාරක මඟ පෙන්වීමේ සේවා

8.3.2 හෝටල් වර්ගීකරණය

සංචාරක හෝටල් වර්ගීකරණය කිරීම සම්බන්ධයෙන් අංක 1963/28 දරන 2016 අප්‍රේල් 20 දිනැතිව හඳුන්වා දී ඇති නව ගැසට් නිවේදනයට අනුව සියලුම සංචාරක හෝටල් වර්ගීකරණය කිරීම අනිවාර්ය අවශ්‍යතාවක් බවට පත් වී ඇත. නව ගැසට් නිවේදනයට අනුව, සංචාරක හෝටල් වර්ගීකරණය කිරීම සඳහා හෝටල් වර්ගීකරණ කමිටුව විධිමත් පරීක්ෂණ සිදු කර ඇත. 2017 වර්ෂයේ දී හෝටල් 25ක් පහත දක්වා ඇති පරිදි වර්ගීකරණය කර ඇත.

තරු 5 හෝටල් - 3 තරු 2 හෝටල් - 5
තරු 4 හෝටල් - 2 තරු 1 හෝටල් - 6
තරු 3 හෝටල් - 9

8.3.3 මාර්ගෝපදේශ සම්පාදනය කිරීම සහ සංචාරක සේවා ගැසට් කිරීම

පහත සඳහන් සම්පූර්ණ කරන ලද මාර්ගෝපදේශ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

- ස්වාධීන සංචාරක අවන්හල්
- අමුත්තන්ගේ නිවාස
- නේවාසික හෝටල්
- ආයුර්වේද හෝටල්
- ආයුර්වේද සුව සේවා මධ්‍යස්ථාන
- සංචාරක සාප්පු
- ස්පා සහ සුවතා මධ්‍යස්ථාන

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ සහ නිර්දේශ සඳහා පහත දක්වා ඇති මාර්ගෝපදේශවල අවසන් කෙටුම්පත් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇත.

- සංචාරක මාර්ගෝපදේශ සේවා
- කුළුබඩු උද්‍යාන
- වාහන සඟාරි චාරිකා
- සංචාරක කළමනාකරණ සමාගම

අග්‍රාමාත්‍ය කාර්යාලයේ මධ්‍යම ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ උපදේශනවලට අනුකූලව, සියලුම අසීරු සහ පුදුම දනවන (Adventure Tourism) සංචාරක ක්‍රියාකාරකම් සඳහා මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ කටයුතු මේ වන විට ද ක්‍රියාත්මකව පවතී. ඉඩම්, ජලය සහ ගුවන ආශ්‍රිත අසීරු සහ පුදුම දනවන (Adventure Tourism) සංචාරක ක්‍රියාකාරකම් සඳහා උපදේශන කමිටු පත් කර ඇති අතර උපදේශන කමිටු රැස්වීම් ද පවත්වනු ලැබේ.

8.3.4 නත්ත්ව සහ සේවා ප්‍රමිති ඉහළ නැංවීම

සංචාරක සහ හෝටල් කළමනාකරණය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ දී 2017 අගෝස්තු 23 වන දා පුහුණු වැඩසටහනක් පවත්වන ලද අතර දේශීය පවුල් ජීවත් වන නිවාස ඒකක සංචාරක කටයුතු සඳහා මෙහෙයවනු ලබන පුද්ගලයන් 106 දෙනෙකු සඳහා මෙම පුහුණු වැඩසටහනට සහභාගී වීම වෙනුවෙන් සහතික පිරිනමනු ලැබිය.

Home Stay පුහුණු වැඩසටහන්

8.3.5 මහනගර සහ ප්‍රදේශ තුළ පවතින හෝටල්වල අවම ස්ථාවර කාමර ගාස්තු පවත්වා ගෙන යෑම

අවම කාමර ගාස්තු පිළිබඳ ගැසට් නිවේදනයට අනුකූලව කටයුතු කිරීම පිළිබඳව තහවුරු කර ගැනීම සඳහා ගජ්මා ඇන්ඩ් කම්පැණි (වරලත් ගණකාධිකාරීවරු) මගින් හෝටල් විගණනය කිරීමේ කටයුතු 2017 නොවැම්බර් 01 වන දා ආරම්භ කරනු ලැබීය. වර්ගීකරණය කරන ලද ඉතිරි හෝටල් විගණනය කිරීමේ කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතින අතර 2017 වර්ෂයේ අවසානය වන විට පහත දක්වා ඇති හෝටල් මේ වන විටත් විගණනයට භාජනය කර ඇත.

- කොළඹ ටාජ් සමුද්‍රා හෝටලය
- කොළඹ සිනමන් ලේක්සයිඩ් හෝටලය
- කොළඹ හිල්ටන් හෝටලය

8.3.6 අවිධිමත් අංශයට අයත් සංචාරක ආයතන අන්තර්ග්‍රහණය කිරීම

අවිධිමත් අංශයට අයත් සංචාරක ආයතන සහ සේවා සපයන්නන් සංචාරක කර්මාන්තයේ විධිමත් අංශයට අන්තර්ග්‍රහණය කිරීම සඳහා ක්ෂණික වැඩසටහනක් පවත්වනු ලැබූ අතර පහත දක්වා ඇති පරිදි බලපත් නිකුත් කරන ලදී.

සීගිරිය	- 11	මිරිස්ස	- 01
උණවටුන	- 14	කල්පිටිය	- 04
හික්කඩුව	- 08	එකතුව	- 95
ඇල්ල	- 57		

8.3.7 ජංගම සංචාරක සේවා

සංචාරක සේවා සපයන්නන් අතර දූනුවත්බව ඇති කිරීමේ කටයුතු සඳහා මෙන්ම ලියාපදිංචි කිරීමේ ක්‍රියාපටිපාටි සහ අළුත් කිරීමේ ක්‍රියාපටිපාටි කඩිනම් කිරීම සඳහා ද සංචාරක ජංගම සේවා පවත්වන ලදී. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සමඟ ඒකාබද්ධව ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව **(IFC)** පහත සඳහන් කර ඇති ජංගම සංචාරක සේවා සඳහා අරමුදල් සපයන ලදී.

- **මන්නාරම** - 2017 මාර්තු මාසයේ දී පවත්වන ලද අතර සේවා සැපයුම්කරුවෝ 56 දෙනෙක් මේ සඳහා සහභාගී වූහ. සංචාරක පහසුකම් සැපයුම්කරු යනුවෙන් සඳහන් කළ හැඳුනුම්පත් සහභාගීවන්නන් 12 දෙනෙකු සඳහා නිකුත් කරන ලදී.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මගින් පහත සඳහන් ප්‍රදේශවල අවිධිමත් අංශයේ සංචාරක සේවා සැපයුම්කරුවන් සංචාරක කර්මාන්තයේ විධිමත් අංශයට අන්තර්ග්‍රහණය කිරීම සඳහා සංචාරක ජංගම සේවයක් ආරම්භ කරන ලදී.

- **කල්පිටිය** - 2017 පෙබරවාරි මාසයේ දී පවත්වන ලද අතර සංචාරක සේවා සැපයුම්කරුවෝ 132 දෙනෙක් මේ සඳහා සහභාගී වූහ.
- **මිරිස්ස** - 2017 ඔක්තෝබර් මාසයේ දී පවත්වන ලද අතර සංචාරක සේවා සැපයුම්කරුවෝ 83 දෙනෙක් මේ සඳහා සහභාගී වූහ.
- **ඇල්ල** - 2017 මාර්තු මාසයේ දී පවත්වන ලද අතර සංචාරක සේවා සැපයුම්කරුවෝ 57 දෙනෙක් මේ සඳහා සහභාගී වූහ.

සංචාරක සේවා සපයන්නන් සඳහා දැනුවත් කිරීමේ වැඩමුළුව

8.4 ජාත්‍යන්තර අත්දැකීම් ලබා ගැනීම සහ ධාරිතා සංවර්ධනය

8.4.1 2017 වර්ෂයේ දී ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සඳහා සහභාගී වීම

1. එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානය (UNWTO) මගින් සංවර්ධනය සඳහා වන තිරසාර සංචාරක කර්මාන්තයේ ජාත්‍යන්තර වසර - 2017 ස්පාඤ්ඤයේ මැඩ්රිඩ් නගරයේ දී 2017 ජනවාරි 18 සිට 22 වන දා දක්වා පවත්වන ලදී.
2. ජාත්‍යන්තර සංවාදය පිළිබඳ 4 වන ලෝක සංසදය, 2017 මැයි 5 වන දා සිට 6 වන දා දක්වා අසර්බයිජාන් දේශයේ බාකු නගරයේ දී පවත්වන ලදී.
3. ලෝක සංචාරක සංවිධානයේ නැගෙනහිර ආසියාව සහ ශාන්තිකර රටවල් සඳහා වූ කොමිෂන් සභාව සහ ලෝක සංචාරක සංවිධානයේ දකුණු ආසියාව සඳහා වූ කොමිෂන් සභාව අතර 29 වන ඒකාබද්ධ රැස්වීම 2017 මැයි 15 වන දා සිට 17 වන දා දක්වා බංගලාදේශයේ චිතගොංග්ග් නගරයේ දී පවත්වන ලදී.
4. 2017 ජූනි 2 වන දා තායිලන්තයේ බැංකොක් නගරයේ දී පැවැත් වූ ශ්‍රී ලංකාව සහ තායිලන්තය අතර වෙළඳාමට අදාළ කරුණු පිළිබඳ අතුරු කමිටුවේ 2 වන රැස්වීමට සහභාගි වීම.
5. සංචාරක කර්මාන්ත සංඛ්‍යාලේඛන පිළිබඳ 6 වන අන්තර්ජාතික සම්මන්ත්‍රණය: තිරසාර සංචාරක කර්මාන්තය මැනීම 2017 ජූනි 21 වනදා සිට 24 වන දා දක්වා පිලිපීනයේ මැනිලා නගරයේ දී පවත්වන ලදී.

8.4.2 ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO) සහ ශ්‍රී ලංකා රජය (GoSL) අතර සහයෝගීතාව

"බුදධිමය දේපළ, සංචාරක කර්මාන්තය සහ සංස්කෘතිය" නම් වූ ලෝක බුද්ධිමය දේපළ සංවිධානයේ **(WIPO)** ව්‍යාපෘතිය සඳහා සහභාගී වීමට තෝරා ගන්නා ලද නියමු රටවල් හතර අතරින් එක් රටක් වන්නේ ශ්‍රී ලංකාවයි.

ශ්‍රී ලංකාවේ "බුද්ධිමය දේපළ, සංචාරක කර්මාන්තය සහ සංස්කෘතිය" මාතෘකාවෙන් යුත් ව්‍යාපෘතියේ අරමුණු

- ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළවල කාර්යභාරය පිළිබඳව දැනුවත්භාවය ප්‍රවර්ධනය කිරීමට මෙම ව්‍යාපෘතිය මගින් දායකත්වය ලැබෙන අතර එම ව්‍යාපෘතිය මගින් දිවයිනේ සංචාරක කර්මාන්තයට අදාළ ආර්ථික කටයුතු මෙහෙයවීම සඳහා ද දායකත්වයක් ලැබෙනු ඇත.
- තවද, කරුණු 10 ක් සහිත ක්‍රියාකාරී සැලැස්මක් මගින් දැනට පවත්වා ගෙන යනු ලබන ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO) සහ ශ්‍රී ලංකා රජය (GoSL) අතර සහයෝගීතාව යටතේ නව ක්ෂේත්‍රයක් සංවර්ධනය කිරීම සඳහා බුද්ධිමය දේපළ භාවිත කිරීමේ විෂය පථය වැඩි දියුණු කිරීම ද මෙම ව්‍යාපෘතිය මගින් සිදු වනු ඇත.
- වර්ධන සහ සංවර්ධන ප්‍රතිපත්ති රාමුව තුළ ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ ධාරිතා සංවර්ධනය සහ බුද්ධිමය දේපළ සහ සංචාරක කර්මාන්තය අතර ගැළපීම පිළිබඳව දැනුවත්භාවය වර්ධනය කිරීමට ද මෙම ව්‍යාපෘතිය මගින් අරමුණු කෙරේ.
- ලේඛනගත කරන ලද අත්දැකීම් සහ විශිෂ්ට පරිචයන් සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මකව පවතින කාලය තුළ සංවර්ධනය කරන ලද ක්‍රමෝපාය, මෙවලම් සහ ප්‍රායෝගික මාර්ගෝපදේශ මගින් ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ දී ඒ සඳහා මඟපෙන්වීමට සහ ජාතික ආර්ථික, සමාජීය සහ සංස්කෘතික ප්‍රතිලාභ වැඩි දියුණු කරන අතරතුර සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේදී IP භාවිතය. ජාතික සහ හෝ දේශීය දැනුම, සම්ප්‍රදාය සහ සංස්කෘතිය පිළිබඳව මහජනතාවගේ දැනුවත්භාවය ඉහළ නැංවීමට ද මෙම ව්‍යාපෘතිය මගින් දායකත්වය ලබා දෙයි.

2017 වසරේ නොවැම්බර් මාසයේදී ප්‍රකාශයට පත් කරන ලද ලෝක බුද්ධිමය දේපළ සංවිධානයේ අධ්‍යයන වාර්තාව එළි දැක්වීම

ටොසෝ මෙනවිය කොළඹ දී පැවැත්වූ වැඩමුළුව සඳහා සහභාගී වූවන් ඇමතීම

8.4.3 2017 වසරේ පවත්වන ලද ලෝක සංචාරක දින ජාතික සැමරුම

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මෙම වසරේ ලෝක සංචාරක දිනය "තිරසාර සංචාරක කර්මාන්තය - සංවර්ධනය සඳහා මෙවලමක්" යන තේමාව යටතේ 2017 සැප්තැම්බර් 27 දින සිට 28 දින දක්වා පෙරවරු 10.00 සිට පස්වරු 8.00 දක්වා කාලපරිච්ඡේදය තුළ කොළඹ නිදහස් චතුරශ්‍ර Arcade හි දී සමරන ලදී.

තිරසාරබවින් ද, වගකීම් සහගත, විශ්වය පුරා පිළිගැනීමට ලක් වූ සංචාරක කර්මාන්තයක් පවත්වා ගෙන යෑම සඳහා එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානය (UNWTO) මගින් ලෝක සංචාරක දිනය ස්ථාපනය කරන ලදී.

සංචාරක කර්මාන්තයේ වැදගත්කම සහ එම කර්මාන්තයේ සමාජීය, සංස්කෘතික, දේශපාලනික සහ ආර්ථිකමය වටිනාකම පිළිබඳව ජාත්‍යන්තර ප්‍රජාව දැනුවත් කිරීම සඳහා සෑම වර්ෂයකම සැප්තැම්බර් 27 වන දා ලොව පුරා ජනතාව ලෝක සංචාරක දිනය සමරති.

සංචාරක කර්මාන්තය මගින් මෙහෙයවනු ලබන ආර්ථික සහිත රටවල් සහ කලාප තිරසාර නොවන සංචාරක ව්‍යාපාරය ආශ්‍රිතව ඇති වන පාරිසරික මෙන්ම සමාජ සංස්කෘතික ගැටළු පිළිබඳව ඉහළ අවධානයක් යොමු කරයි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සංචාරක කර්මාන්තයේ පාරිසරික බලපෑම අවම කිරීමට මෙන්ම සංචාරක ගමනාන්තවල සමාජ ආර්ථික සහ සමස්ත ප්‍රතිලාභ උපරිමකරණය කිරීම සඳහා තිරසාර සංචාරක කර්මාන්තයක් සංවර්ධනය කිරීමේ කටයුතු ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාව පිළිබඳව ඉහළ මට්ටමේ එකඟත්වයක් ඇති වෙමින් පවතී.

මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීමේ අරමුණින්, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) ලෝක සංචාරක දිනය සැමරීම සඳහා පහත දක්වෙන ක්‍රියාකාරකම් සංවිධානය කරන ලදී.

- තිරසාර සංචාරක ව්‍යාපාරය පිළිබඳ ප්‍රදර්ශන පැවැත්වීම: රජයේ සංවිධාන, පළාත් සභා සහ සංචාරක කර්මාන්තයේ නිරතව සිටින ප්‍රමුඛ පෙළේ හෝටල් සහ ප්‍රධාන සංගම් ඒකාබද්ධව මෙම ප්‍රදර්ශනය ඉදිරිපත් කරන ලදී.
- "ආදරණීය ශ්‍රී ලංකාව" යන රූපවාහිනී චාරිකා වැඩසටහන මත පදනම් ව ඡායාරූප ප්‍රදර්ශනයක් පවත්වන ලදී.
- බස්නාහිර, දක්ෂිණ සහ මධ්‍යම පළාත්වල පිහිටි වඩාත් ජනප්‍රියත්වයට පත් නොවූ සංචාරකයන් සඳහා ආකර්ෂණීය ස්ථාන පිළිබඳව ලියවුණු ග්‍රන්ථ 3 ක් එළි දැක්වීම.
- මෙම මාතෘකාව පිළිබඳව දිවයින පුරා පිහිටි පාසල් අතර රචනා තරඟයක් පවත්වන ලදී.
- "ආදරණීය ශ්‍රී ලංකාව" නම් වූ ඡායාරූප ප්‍රදර්ශනයේ සහ රචනා තරඟයේ ජයග්‍රාහකයන් සඳහා සහතික පත් සහ සම්මාන ප්‍රදානෝත්සවයක් පැවැත්වීම.
- කොළඹ දිස්ත්‍රික්කයේ පිහිටි "සංචාරක හිතකාමී හෝජනාගාර" සඳහා සහතිකපත් ප්‍රදානය කිරීම.

ඡායාරූප ප්‍රදර්ශනය - ආදරණීය ශ්‍රී ලංකා

8.5 දේශීය සංචාරක ව්‍යාපාරය සහ ප්‍රජා සම්බන්ධතා (DT & CR)

වාහන ලිසිං වාරික	1,743,917	9,434,868
කල්බදු ගිවිසුම් මත මාරු කල යුතු අවිනිශ්චිත පොලි වියදම	(94,614)	(866,338)
එකතුව	**1,649,303**	**8,568,530**

11.02 කල්බදු හිමියෝ - ජංගම නොවන

	2017 (රු.)	2016 (රු.)
වාහන ලිසිං වාරික	-	11,084,171
කල්බදු ගිවිසුම් මත මාරු කල යුතු අවිනිශ්චිත පොලි වියදම	-	(866,338)
	-	(8,568,530)
එකතුව	**-**	**1,649,303**

12. විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිපාදන

	2017 (රු.)	2016 (රු.)
ඉදිරියට ගෙන එන ලද ගෙවිය යුතු පාරිතෝෂික	54,204,721	52,288,318
අඩු කලා - 2017 වසරේ පාරිතෝෂික ගෙවීම්	6,266,210	2,795,731
අනු එකතුව	47,938,512	49,492,587
එකතු කලා - පාරිතෝෂික ප්‍රතිපාදන 2017	4,084,528	4,712,134
2017.12.31 දිනට මුළු ගෙවිය යුතු පාරිතෝෂික එකතුව	**52,023,039**	**54,204,721**

අවම සේවා කාලය (අවමය වර්ෂ 5) සම්පූර්ණ නොකල සේවකයන් සඳහා පාරිතෝෂික වෙන්කිරීම් සිදු කර ඇත.

13. අපගමන

බදු

	2017 (රු.)	2016 (රු.)
වර්ෂය සඳහා අපගමන බදු	333,035,950	329,761,779
එකතුව	**333,035,950**	**329,761,779**

14. සංචාරක සංවර්ධන බදු

	2017 (රු.)	2016 (රු.)
වර්ෂයේ සංචාරක සංවර්ධන බදු	211,424,320	179,476,385
එකතු- අධි ප්‍රතිපාදන (ඇස්තමේන්තු වෙනස)	5,176,909	-
එකතුව	**216,601,229**	**179,476,385**

15. බලපත්‍ර ගාස්තු සහ අනෙකුත් ගාස්තු

	2017 (රු.)	2016 (රු.)
ඉඩම් බදුකුලි ආදායම - ප්‍රධාන කාර්යාලය	56,596,596	41,445,274
බලපත්‍ර ගාස්තු/පරිපාලන ගාස්තු/වීසා ගාස්තු	112,524,030	68,064,450
ජාතික සංචාරක ආයෝජන ඒකකය	10,263,793	7,469,273
සංචාරක සංවර්ධන අරමුදල - පරිපාලන ගාස්තු	7,539,949	6,442,081
එකතුව	**186,924,368**	**123,421,078**

16. අතිරික්ත/(හිඟය) - දේශීය සංචාරක නිකේතන මෙහෙයුම්

	2017 (රු.)	2016 (රු.)
කතරගම	(3,892,994)	(2,671,177)
නුවරඑළිය	(2,862,849)	(2,554,366)
බණ්ඩාරවෙල	(850,433)	(2,188,086)
අනුරාධපුර	(5,421,470)	(3,126,060)
බෙන්තොට	21,409,314	21,944,985
පොලොන්නරුව/ගිරිතලේ	3,547,544	3,003,045
කල්කුඩා	(15,320,870)	(18,308,620)
අතිරික්ත/(හිඟය) - ජාතික නිවාඩු නිකේතන මෙහෙයුම්	**(3,391,757)**	**(3,900,279)**

17. වෙනත් ආදායම්

	2017 (රු.)	2016 (රු.)
පොලි ආදායම - සේවක ණය	584,499	571,126
බැංකු පොලි	862,127	886,108
බැංකු පොලිය - අරමුදල් කළමනාකරණ ගිණුම	43,561,621	32,654,342
වත්කම් විකිණීමේ ලාභ	4,301,578	4,805,362
වෙනත් ආදායම්	5,177,503	1,745,742
ප්‍රතිවර්ථනය කරන ලද උපචිත වියදම්	10,550,023	8,325,722
ලාභාංශ ආදායම්	400,000	180,000
විනිමය ලාභ	-	9,724
එකතුව	**65,437,350**	**49,178,126**

18. වේතන,වැටුප් හා සේවක ප්‍රතිලාභ

	2017 (රු.)	2016 (රු.)
වැටුප් හා දීමනා	73,832,271	67,552,713
නිවාඩු හා අනෙකුත් දීමනා	329,190	475,093
අතිකාල දීමනා	2,587,316	2,860,631
සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය	76,916,805	7,095,037
සේවක භාරකාර අරමුදල් දායකත්වය	9,965,843	1,412,914
සේවක සුභසාධනය	25,023,097	17,703,699
කාර්යය මණ්ඩල නිලඇඳුම්	385,095	301,014
ගමන් වියදම් - දේශීය	781,967	515,314
පාරිතෝෂික දීමනා	4,019,114	4,844,049
පැමිණීමේ දිරිදීමනා	3,164,935	2,633,699
එකතුව	**197,005,633**	**105,394,162**

19. සැපයුම් හා පාරිභෝජන භාණ්ඩ

	2017 (රු.)	2016 (රු.)
සංග්‍රහ වියදම් - දේශීය	855,493	1,678,740
විවිධ සැපයුම්	1,601,193	1,736,103
පිරිසිදු කිරීමේ සැපයුම්	12,876	
ආරක්ෂක වියදම්	4,812,703	3,858,070
පිරිසිදු කිරීමේ වියදම්	7,519,153	4,449,547
ලිපිද්‍රව්‍ය	4,794,242	3,844,893
දුරකථන	13,048,014	7,391,727
තැපැල් ගාස්තු හා මුද්දර ගාස්තු	2,999,136	3,211,009
විදුලි බිල්පත්	8,300,651	9,380,687
වරිපනම් හා බලපත්‍ර	1,042,545	1,054,820
රක්ෂණය - ස්ථාවර වත්කම්	1,494,090	1,489,468
නඩත්තු වියදම් - ගොඩනැගිලි	5,559,919	1,097,622
නඩත්තු වියදම් - උපකරණ	3,664,603	4,416,584
ප්‍රචාරණ වියදම්	4,624,067	3,579,760
නෛතික වියදම්	1,094,876	505,819
වාහන කුලී	13,322,659	2,452,888
වාහන නඩත්තුව හා අළුත්වැඩියාව	7,544,311	7,743,701
ජල බිල්පත්	1,252,186	972,303
බොල් හා අඩමාණ ණය වෙන්කිරීම්	49,308	1,279,718
එකතුව	**83,592,027**	**60,143,458**

20. අලෙවි වියදම්

	2017 (රු.)	2016 (රු.)
සංඛ්‍යානමය සම්ක්ෂණය	937,938	1,307,420
හොටල් වර්ගීකරණ වියදම්	5,879,381	5,047,293
විදේශ ගමන් වියදම්	8,288,681	3,773,006
මුද්‍රණ හා ප්‍රකාශන වියදම්	2,420,709	1,000,655
සම්මන්ත්‍රණ හා සමුළු වියදම්	12,047,781	38,267,286
ජාත්‍යන්තර සංවිධාන බලපත්‍ර වියදම්	9,165,416	8,265,645
ප්‍රජා සම්බන්ධතා	7,576,233	1,757,244

ජාතික සංචාරක ආයෝජන ඒකකය	1,673,741	1,032,099
සේවක පුහුණුව/උපදේශන සේවා	2,276,633	2,575,328
පොත් හා වාර ප්‍රකාශන	296,970	278,480
තක්ෂණය හා සන්නිවේදන උපකරණ නඩත්තු වියදම්	16,829,336	9,239,875
කල්පිටිය වියදම්	1,217,072	1,171,908
යාල වන නිකේතන ව්‍යාපෘති වියදම්	445,648	235,354
කුච්චවේලී ව්‍යාපෘති වියදම්	132,739	-
නව නිපැයුම් සංවර්ධන ව්‍යාපෘති	171,871	866,301
සංවර්ධන වියදම් - ජාතික නිවාඩු නිකේතනය	128,792	42,235
සංචාරක කලාප සංවර්ධන වියදම්	6,000,001	
ප්‍රවර්ධන හා ප්‍රචාරණ වියදම්	13,714,178	11,308,588
එකතුව	**89,203,117**	**86,168,720**

21. වෙනත් වියදම්

	2017 (රු.)	2016 (රු.)
අධ්‍යක්ෂක මණ්ඩල දීමනා	962,969	620,000
විගණන ගාස්තු	578,738	806,785
විනිමය ලාභ/අලාභ	2,226	-
එකතුව	**1,543,932**	**1,426,785**

22. මූල්‍ය පිරිවැය

	2017 (රු.)	2016 (රු.)
මූල්‍ය ගාස්තු	771,724	2,639,989
බැංකු ගාස්තු	164,171	137,561
එකතුව	**935,895**	**2,777,550**

2017 දෙසැම්බර් 31 අවසන් වන කාලපරිච්ඡේදය සඳහා
නිකේතන මෙහෙයුම් සාරාංශය

	2017 (රු.)	2016 (රු.)
ජාතික නිවාඩු නිකේතන - දේශීය සංචාරක ව්‍යාපාර		
කතරගම	(3,892,994)	(2,671,177)
නුවරඑළිය	(2,862,849)	(2,554,366)
බණ්ඩාරවෙල	(850,433)	(2,188,086)
අනුරාධපුරය	(5,421,470)	(3,126,060)
අනු එකතුව	**(13,027,746)**	**(10,539,689)**
ජාතික නිවාඩු නිකේතන සේවා සහ කුළි ආදායම් උත්පාදන		
බෙන්තොට	21,409,314	21,944,985
පොළොන්නරුව/ගිරිතලේ	3,547,544	3,003,045
කල්කුඩා	(15,320,870)	(18,308,620)
අනු එකතුව	**9,635,988**	**6,639,409**
අතිරික්තය/(හිඟය)	**(3,391,757)**	**(3,900,279)**

ජාතික නිවාඩු නිකේතනය - කතරගම
2017 දෙසැම්බර් 31 අවසන් වන කාලපරිච්ඡේදය සඳහා
ආදායම් ප්‍රකාශනය

	සටහන	2017 රු.	2016 රු.
භෝජනාගාර අලෙවිය		8,174,869	9,572,624
අඩු කලා - විකුණුම් පිරිවැය		4,233,598	4,957,953
දළ ආදායම		**3,941,271**	**4,614,672**
කාමර අලෙවිය		12,658,060	13,875,017
වෙනත් ආදායම්		313	520
දළ ලාභය		**16,599,644**	**17,338,641**
අඩු කලා - ආයතන හා පරිපාලන වියදම්		16,072,338	17,338,641
ක්ෂය වීම්		4,420,300	3,822,744
අතිරික්තය/(හිඟය)		**(3,892,994)**	**(2,671,177)**
ආයතන හා පරිපාලන වියදම්		**6,948,898**	**7,298,494**
වැටුප් හා දීමනා		6,948,898	7,298,494
අතිකාල දීමනා		320,518	398,228
සේවක අර්ථසාධක අරමුදල දායකත්වය		941,055	770,751
සේවක භාරකාර අරමුදල දායකත්වය		188,211	154,150
සේවක සුභසාධනය සහ සංග්‍රහ වියදම්		428,271	461,136
සේවක ආහාර වියදම්		564,096	579,911
සේවක නිලඇඳුම්		170,936	168,540
පිරිසිදු කිරීම් සැපයුම්		284,074	103,741
විවිධ සැපයුම්		49,798	144,588
ආරක්ෂක වියදම්		900,237	1,386,030
පිරිසිදු කිරීමේ ගාස්තු		1,232,739	1,689,168
දුරකථන		176,699	134,340
ලිපිද්‍රව්‍ය		107,310	102,834
තැපැල් ගාස්තු හා මුද්දර ගාස්තු		60,890	56,855
විදුලි බිල්පත්		1,118,967	1,372,046
වරිපනම් හා බලපත්‍ර		67,032	23,728
රක්ෂණය - ස්ථාවර වත්කම්		4,990	2,789
රෙදි සේදීම් වියදම්		372,457	516,308
නඩත්තු වියදම් - ගොඩනැගිලි		414,153	107,659
නඩත්තු වියදම් - උපකරණ		112,142	115,036
ප්‍රවාහන හා භාණ්ඩ පැටවීම් ගාස්තු		52,000	-
බැංකු ගාස්තු		6,950	2,000
වාහන නඩත්තුව හා අළුත්වැඩියාව		58,365	51,780
පොත් හා වාර සඟරා		11,031	13,618
පැමිණීමේ දිරිගැන්වීම්		346,290	467,059
ආර්ථික සේවා ගාස්තු		-	-
ජල බිල්පත්		1,134,230	1,217,851
එකතුව		**16,072,338**	**17,338,641**

ජාතික නිවාඩු නිකේතනය - නුවරඑළිය
2017 දෙසැම්බර් 31 අවසන් වන කාලපරිච්ඡේදය සඳහා
ආදායම් ප්‍රකාශනය

	සටහන	2017 රු.	2016 රු.
භෝජනාගාර අලෙවිය		6,654,422	7,504,180
අඩු කලා - විකුණුම් පිරිවැය		2,898,136	3,086,119
දළ ආදායම		**3,756,286**	**4,418,061**
කාමර අලෙවිය		10,091,759	9,415,629
වෙනත් ආදායම්		386,924	241,711
අනු එකතුව		**10,478,683**	**9,657,341**
දළ ලාභය		**14,234,968**	**14,075,401**
අඩු කලා - ආයතන හා පරිපාලන වියදම්		14,265,352	14,651,472
ක්ෂය වීම්		2,832,465	1,978,295
අතිරික්තය/(හිඟය)		**(2,862,849)**	**(2,554,366)**
ආයතන හා පරිපාලන වියදම්			
වැටුප් හා දීමනා		6,151,163	6,225,169
අතිකාල දීමනා		234,551	359,807
සේවක අර්ථසාධක අරමුදල දායකත්වය		864,204	658,075
සේවක භාරකාර අරමුදල දායකත්වය		172,841	131,615
සේවක සුභසාධනය සහ සංග්‍රහ වියදම්		471,640	428,377
දේශීය ගමන් ගාස්තු		2,000	
දේශීය විනෝදාශ්වාදය		-	17,806
සේවක ආහාර වියදම්		293,142	224,793
සේවක නිලඇඳුම්		120,766	112,380
පිරිසිදු කිරීම් සැපයුම්		298,049	149,512
විවිධ සැපයුම්		324,420	237,452
ආරක්ෂක වියදම්		907,154	1,225,101
පිරිසිදු කිරීමේ ගාස්තු		1,171,125	1,830,535
ලිපිද්‍රව්‍ය		63,147	70,246
දුරකථන		202,229	184,186
තැපැල් ගාස්තු හා මුද්දර ගාස්තු		59,245	56,189
විදුලි බිල්පත්		1,735,250	1,797,890
වරිපනම් හා බලපත්‍ර		79,098	88,549
රක්ෂණය - ස්ථාවර වත්කම්		15,542	8,685
රෙදි සේදීම් වියදම්		268,881	227,468
නඩත්තු වියදම් - ගොඩනැගිලි		182,546	74,794
නඩත්තු වියදම් - උපකරණ		67,973	50,260
ප්‍රවාහන හා භාණ්ඩ රැගෙන ඒම		7,130	44,850
බැංකු ගාස්තු		-	10,060
වාහන නඩත්තුව හා අළුත්වැඩියාව		54,463	16,629
පොත් හා වාර සඟරා		16,370	12,160
පැමිණීමේ දිරිගැන්වීම්		318,244	268,349
ජල බිල්පත්		184,179	140,537
එකතුව		**14,265,352**	**14,651,472**

ජාතික නිවාඩු නිකේතනය - බණ්ඩාරවෙල
2017 දෙසැම්බර් 31 අවසන් වන කාලපරිච්ඡේදය සඳහා
ආදායම් ප්‍රකාශනය

	සටහන	2017 රු.	2016 රු.
භෝජනාගාර අලෙවිය		10,188,838	9,139,450
අඩු කලා - විකුණුම් පිරිවැය		3,763,881	3,781,521
දළ ආදායම		**6,424,957**	**5,357,929**
කාමර අලෙවිය		9,314,328	9,043,813
වෙනත් ආදායම්		498,750	382,752
අනු එකතුව		**9,813,078**	**9,426,565**
දළ ලාභය		**16,238,035**	**14,784,494**
අඩු කලා - ආයතන හා පරිපාලන වියදම්		13,723,368	13,946,223
ක්ෂය වීම්		3,365,099	3,026,357
අතිරික්තය/(හිඟය)		**(850,433)**	**(2,188,086)**
ආයතන හා පරිපාලන වියදම්			
වැටුප් හා දීමනා		6,188,951	6,073,827
අතිකාල දීමනා		280,094	292,926
සේවක අර්ථසාධක අරමුදල දායකත්වය		838,983	628,864
සේවක භාරකාර අරමුදල දායකත්වය		165,324	125,773
දේශීය විනෝදාශ්වාදය		1,216	637,326
සේවක සුභසාධනය සහ සංග්‍රහ වියදම්		403,731	
දේශීය ගමන් ගාස්තු		2,000	-
සේවක ආහාර වියදම්		535,975	501,778
සේවක නිලඇඳුම්		130,301	139,648
පිරිසිදු කිරීම් සැපයුම්		139,374	89,704
විවිධ සැපයුම්		266,867	118,321
ආරක්ෂක වියදම්		900,237	1,266,133
පිරිසිදු කිරීමේ ගාස්තු		1,196,203	1,790,032
ලිපිද්‍රව්‍ය		31,893	28,591
දුරකථන		133,274	91,929
තැපැල් ගාස්තු හා මුද්දර ගාස්තු		58,275	47,840
විදුලි බිල්පත්		1,220,256	1,327,988
වරිපනම් හා බලපත්‍ර		22,281	17,281
රක්ෂණය - ස්ථාවර වත්කම්		4,046	4,379
රෙදි සේදීම් වියදම්		278,094	249,365
නඩත්තු වියදම් - ගොඩනැගිලි		312,057	108,170
නඩත්තු වියදම් - උපකරණ		134,122	11,780
ප්‍රවාහන හා භාණ්ඩ පැටවීම ගාස්තු		900	16,330
බැංකු ගාස්තු		4,085	16,000
වාහන නඩත්තුව හා අළුත්වැඩියාව		79,026	48,345
පොත් හා වාර සඟරා		13,220	12,480
පැමිණීමේ දිරිගැන්වීම්		246,164	293,968
ජල බිල්පත්		136,420	7,447
එකතුව		**13,723,368**	**13,946,223**

ජාතික නිවාඩු නිකේතනය - අනුරාධපුර
2017 දෙසැම්බර් 31 අවසන් වන කාලපරිච්ඡේදය සඳහා
ආදායම් ප්‍රකාශනය

	සටහන	2017 රු.	2016 රු.
භෝජනාගාර අලෙවිය		4,784,569	3,698,440
අඩු කලා - විකුණුම් පිරිවැය		2,263,149	1,874,598
දළ ආදායම		**2,521,421**	**1,823,842**
කාමර අලෙවිය		5,687,700	4,632,925
වෙනත් ආදායම්		37,949	0
අනු එකතුව		**5,725,648**	**4,632,925**
දළ ලාභය		**8,247,069**	**6,456,767**
අඩු කලා - ආයතන හා පරිපාලන වියදම්		11,587,684	8,033,399
ක්ෂය වීම්		2,080,855	1,549,428
අතිරික්තය/(හිඟය)		**(5,421,470)**	**(3,126,060)**
ආයතන හා පරිපාලන වියදම්			
වැටුප් හා දීමනා		5,125,144	3,018,549
අතිකාල දීමනා		176,573	108,918
සේවක අර්ථසාධක අරමුදල දායකත්වය		710,182	316,695
සේවක භාරකාර අරමුදල දායකත්වය		142,036	63,339
සේවක ආහාර වියදම්		197,015	393,459
සේවක සුභසාධනය සහ සංග්‍රහ වියදම්		317,660	-
දේශීය ගමන් ගාස්තු		20,000	1,056
දේශීය විනෝදාශ්වාදය		550	-
සේවක නිලඇඳුම්		89,691	59,805
පිරිසිදු කිරීම් සැපයුම්		110,236	73,582
විවිධ සැපයුම්		267,242	88,833
ආරක්ෂක වියදම්		1,041,048	1,081,008
පිරිසිදු කිරීමේ ගාස්තු		1,241,141	1,239,607
ලිපිද්‍රව්‍ය		88,274	35,641
දුරකථන		214,027	171,102
තැපැල් ගාස්තු හා මුද්දර ගාස්තු		57,310	46,685
විදුලි බිල්පත්		815,349	671,857
වරිපනම් හා බලපත්‍ර		84,423	100,194
රක්ෂණය - ස්ථාවර වත්කම්		6,823	10,155
රෙදි සේදීම් වියදම්		137,228	119,696
නඩත්තු වියදම් - ගොඩනැගිලි		178,139	55,991
නඩත්තු වියදම් - උපකරණ		84,703	51,007
ප්‍රවාහන හා භාණ්ඩ පැටවීම ගාස්තු		9,150	6,210
බැංකු ගාස්තු		9,500	3,625
වාහන නඩත්තුව හා අළුත්වැඩියාව		47,918	81,390
පොත් හා වාර සඟරා		19,770	15,851
පැමිණීමේ දිරිගැන්වීම්		304,178	154,315
ජල බිල්පත්		92,375	64,831
එකතුව		**11,587,684**	**8,033,399**

ජාතික නිවාඩු නිකේතනය - බෙන්තොට
2017 දෙසැම්බර් 31 අවසන් වන කාලපරිච්ඡේදය සඳහා
ආදායම් ප්‍රකාශනය

	සටහන	2017 රු.	2016 රු.
කාමර අලෙවිය		10,000	-
කුලි ආදායම (ඉඩම්/ගොඩ බදුදීම්)		36,134,106	32,351,735
වෙනත් ආදායම්		2,996,891	5,947,526
අනු එකතුව		**39,140,998**	**38,299,261**
අඩු කලා - ආයතන හා පරිපාලන වියදම්		13,394,559	12,043,038
ක්ෂය වීම්		4,337,125	4,311,238
අතිරික්තය/(හිඟය)		**21,409,314**	**21,944,985**
ආයතන හා පරිපාලන වියදම්			
වැටුප් හා දීමනා		5,337,934	5,898,824
අතිකාල දීමනා		79,374	74,306
සේවක අර්ථසාධක අරමුදල දායකත්වය		759,440	638,351
සේවක භාරකාර අරමුදල දායකත්වය		151,888	127,670
සේවක සුභසාධනය සහ සංග්‍රහ වියදම්		423,725	447,950
දේශීය ගමන් ගාස්තු		1,292	766
දේශීය විනෝදාශ්වාදය		9,362	10,875
සේවක නිලඇඳුම්		51,540	60,080
විවිධ සැපයුම්		115,660	67,954
ආරක්ෂක වියදම්		3,588,816	1,869,468
පිරිසිදු කිරීම් සැපයුම්		521,811	
ලිපිද්‍රව්‍ය		69,757	48,803
දුරකථන		134,944	96,707
තැපැල් ගාස්තු හා මුද්දර ගාස්තු		35,595	46,800
ජල බිල්පත්		4,800	
විදුලි බිල්පත්		1,233,357	1,698,408
වරිපනම් හා බලපත්‍ර		257,815	122,028
රක්ෂණය - ස්ථාවර වත්කම්		1,710	2,579
කුලි ඉඩම්		45,000	90,000
නඩත්තු වියදම් - ගොඩනැගිලි		218,365	171,959
නඩත්තු වියදම් - උපකරණ		66,101	147,301
ප්‍රවාහන හා භාණ්ඩ පැටවීම ගාස්තු		27,060	11,630
බැංකු ගාස්තු		3,750	4,055
වාහන නඩත්තුව හා අළුත්වැඩියාව		-	780
පොත් හා වාර සඟරා		24,770	22,540
පැමිණීමේ දිරිගැන්වීම් දීමනා		230,696	383,205
එකතුව		**13,394,559**	**12,043,038**

ජාතික නිවාඩු නිකේතනය - පොලොන්නරුව
2017 දෙසැම්බර් 31 අවසන් වන කාලපරිච්ඡේදය සඳහා
ආදායම් ප්‍රකාශනය

	සටහන	2017 රු.	2016 රු.
කුලි ආදායම		3,511,544	2,967,045
වෙනත් ආදායම (ජලය හා අපද්‍රව්‍ය)		36,000	36,000
දළ ලාභය		**3,547,544**	**3,003,045**
අතිරික්තය/(හිඟය)		**3,547,544**	**3,003,045**

ජාතික නිවාඩු නිකේතනය - කල්කුඩා
2017 දෙසැම්බර් 31 අවසන් වන කාලපරිච්ඡේදය සඳහා
ආදායම් ප්‍රකාශනය

	2017 රු.	2016 රු.
කුලි ආදායම	4,947,280	5,219,760
වෙනත් ආදායම්	-	265,862
ජල පරිභෝජන ආදායම්	6,139,974	
අනු එකතුව	**11,087,254**	**5,485,622**
අඩු කලා - ආයතන හා පරිපාලන වියදම්	4,031,500	2,783,623
ක්ෂය වීම්	22,376,623	21,010,620
අතිරික්තය/(හිඟය)	**(15,320,870)**	**(18,308,620)**
ආයතන හා පරිපාලන වියදම්		
වැටුප් හා දීමනා	2,368,384	1,612,391
අතිකාල දීමනා	33,981	89,750
සේවක අර්ථසාධක අරමුදල දායකත්වය	239,966	137,329
සේවක භාරකාර අරමුදල දායකත්වය	47,993	27,466
සේවක සුභසාධනය සහ සංග්‍රහ වියදම්	102,202	65,050
දේශීය ගමන් ගාස්තු	12,000	13,317
දේශීය විනෝදාශ්වාදය	32,508	
සේවක නිලඇඳුම්	12,885	11,595
විවිධ සැපයුම්	74,804	59,195
ආරක්ෂක වියදම්	534,580	515,264
ලිපිද්‍රව්‍ය	359	12,330
දුරකථන	114,279	31,130
තැපැල් ගාස්තු හා මුද්දර ගාස්තු	4,325	20,590
විදුලි බිල්පත්	374,691	119,736
නඩත්තු - ගොඩනැගිලි	33,750	12,400
නඩත්තු - උපකරණ	-	14,980
ප්‍රවාහන හා භාණ්ඩ පැටවීම ගාස්තු	-	-
බැංකු ගාස්තු	-	4,105
පැමිණීමේ දිරිගැන්වීම් දීමනා	44,794	36,994
එකතුව	**4,031,500**	**2,783,623**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } ටීඅයිපී/ඒ/එස්එල්ටීඩීඒ /1/17/01

මෙහේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2018 ඔක්තෝබර් 31 දින

සභාපති,

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී)වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 20 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම, කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොළඳුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙලිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කාර්යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02

සමාලෝචිත වර්ෂයේදී මෝටර් රථයක් විකිණීමෙන් ලද රු.3,660,000 ක මුදල ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

පහත සඳහන් නිරීක්ෂන කරනු ලැබේ.

(i) ප්‍රමිතයේ 49 ඡේදය ප්‍රකාරව, දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමේදී අදාළ වත්කම අයත් දේපල, පිරියත හා උපකරණ පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත්, අධිකාරිය සතු සියලුම ඉඩම් සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරීමකින් තොරව ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩම සහ ගොඩනැගිල්ල පමණක් 2008 වර්ෂයේදී රු.මිලියන1,378 කට ප්‍රත්‍යාගණනය කර ප්‍රත්‍යාගණන අගය මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබුණි.

(ii) ප්‍රමිතයේ 65 ඡේදය ප්‍රකාරව ජංගමනොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.240,036,680 ක් වූ වත්කම් වර්ග 10 ක් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) අධිකාරිය සතු ඉඩම් හා තානායම් වෙනත් පාර්ශවයන්ට බදු දී තිබුණ ද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඒ සම්බන්ධව හෙලිදරව් කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියට අයත් දේපලවල සිදු කරන ලද රු.110,449,509 ක් වූ සංවර්ධන පිරිවැයට අදාල රු.87,063,977 ක සමුච්චිත ක්ෂය ගිණුම්ගත නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අස්පෘශ්‍ය වත්කම් වටිනාකම හා සමුච්චිත ලාභය රු.87,063,977 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී 2016 හා පෙර වර්ෂ වෙනුවෙන් එකතුව රු.51,019,696 ක් සේවක අර්ථ සාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට ගෙවා තිබූ අතර 2016 වර්ෂය වෙනුවෙන් ගෙවූ දායක මුදල් සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමෙන් හා පෙර වර්ෂ වෙනුවෙන් වූ ශේෂයන් සම්බන්ධයෙන් ආරම්භක ශේෂයන් නැවත ප්‍රකාශ කිරීමෙන් අතීතානුයෝගීව නිවැරදි කිරීම වෙනුවට මුළු මුදලම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට ගලපා තිබීම හේතුවෙන් අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.

පහත දැක්වෙන විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

ගිණුම් විෂයය	වටිනාකම (රු.)	ඉදිරිපත් නොකළ සාක්ෂි
(අ) ආයෝජන (සංචාරක මණ්ඩලය)	52,154,738	ආයෝජන සහතිකය හෝ වෙනත් ලිඛිත සාක්ෂි සනාථ කිරීමේ ලිපි
(ආ) ආයෝජන (සංචාරක ප්‍රවර්ධන)	976,509	
(ඇ) සංචාරක අරමුදල	930,000	කොටස් සහතික හෝ වෙනත් ලිඛිත සාක්ෂි හා ශේෂය තහවුරු කිරීමේ ලිපි
(ඈ) නිධන් අරමුදල් ආයෝජන	759,021	
(ඉ) ශ්‍රී ලංකා සීමිත හෝටල් සංචාරක සමාගම	750,000	
(ඊ) වෙළඳ ණයගැතියෝ	60,834,836	ශේෂ සනාථ කිරීමේ ලිපි
(උ) විවිධ ණයගැතියෝ	4,688,558	ශේෂ සනාථ කිරීමේ ලිපි
(ඌ) ජල පරිභෝජන ණයගැතියෝ (පාසිකුඩා)	23,227,328	ශේෂ සනාථ කිරීමේ ලිපි
(එ) පල්දෝරු සේවා සැපයුම් සඳහා ලැබිය යුතු ගාස්තු	124,752,772	ශේෂය සනාථ කිරීමේ ලිපි
(ඒ) ණයගැතියෝ - ජාතික කඩදාසි සංස්ථාව	9,627,113	ශේෂය සනාථ කිරීමේ ලිපි

(ඔ) සැපයුම්කරුවන්ට හා සේවකයන්ටඅත්තිකාරම්	21,302,883	ශේෂය සනාථ කිරීමේ ලිපි
(ඕ) දේපල, පිරියත හා උපකරණ ක්ෂය වීම්	67,624,406	කේවල ශේෂ පදනම් කර ගත් විස්තරාත්මක උපලේඛන
(ක) ඉඩම්	33,904,345	අයිතිය සනාථ කරන ලද ලියවිලි
(ග) තැන්පතු / වෙනත් ගෙවීම්	21,302,882	තැන්පතුව තහවුරු කිරීමට අදාල ලියවිලි

2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අනුව ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයෙන් ලැබිය යුතු විවිධ ණය ගැනි ශේෂ ලෙස රු.18,613,438 ක් දක්වා තිබුණු අතර ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ ගිණුම් වල එම ශේෂය රු.25,812,532 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.7,199,094 ක පැහැදිලි නොකළ වෙනසක් නිරීක්ෂණය විය.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වෙළෙඳ ණයගැතියන්ගෙන් ලැබිය යුතු රු.2,758,157 වර්ෂ 04 කට වැඩි කාලයක්ද රු.59,936,047 ක් වසර 1 ත් 4 ත් අතර කාලයක්ද අය නොවී පැවතුණි.

(ආ) ලැබිය යුතු තැන්පත් වටිනාකම රු.6,963,732 ක් වර්ෂ 5 ට වැඩි කාලයක්ද වර්ෂ 5 ත් 3 ත් අතර කාලයක් තුළ රු.1,700,000 ක්ද අය නොවී පැවතුණි.

(ඇ) පාසිකුඩා ජල පරිභෝජන ණයගැතියන්ගෙන් අයවිය යුතු රු.18,670,721 ක ශේෂයක් වර්ෂ 01 ත් වර්ෂ 02 ත් අතර කාලයක් තුළ අය නොවී පැවතුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව රඳවා ගැනීමේ මුදලින් වර්ෂ 04 ට වැඩි රු. 15,566,948 ක්ද වර්ෂ 02 ට වැඩි වර්ෂ 4 ට අඩු රු. 4,881,330 ක්ද, වර්ෂ 01 ට අඩු රු. 11,026,841 ක්ද නිරවුල් නොකර පැවතුණි.

2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.;

නීති, රීති,රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම්
(අ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ IVපරිච්ඡේදයේ 26(1) උප වගන්තිය	ප්‍රකාශිත සහ සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ඇතුළත කරගෙන යාහැකි සංචාරක කටයුතු, වාණිජ සහ වෙනත් කටයුතු නියම කරමින් නියෝග සාදා නොතිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(I) මුදල් රෙගුලාසි169(2)	චෙක්පත් උපලබ්ධිවීමට පෙර සේවා සපයා තිබීම හේතුවෙන් රු.650,034 ක් වටිනා චෙක්පත් 22කට අදාළ මුදල් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.
(II)මුදල් රෙගුලාසි 396	2010 වර්ෂයෙ සිට 2017 වර්ෂය දක්වා කාල පරාසය තුල නිකුත් කරන ලද එහෙත් උපලබ්ධි නොවූ රු.2,895,858 ක චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(III)මුදල් රෙගුලාසි 757	වටිනාකම රු.1,880,781ක්වූ පුස්තකාල පොත් සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(ඇ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14.1 හා 9.14.2 වගන්ති	මානව සම්පත් කළමනාකරණයට අදාළ නීති හා රෙගුලාසි පිළිබඳ සියලු කරුණු ඇතුළත් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ අත්පොතක් පිළියෙළ කර භාණ්ඩාගාර ලේකම්ගේ එකඟතාවය සහිතව පාලක මණ්ඩලය විසින් අනුමත කළ යුතු වුවත්, අධිකාරිය එම අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කර නොතිබුණි.
(ඈ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.385,538,658 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.373,897,908 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.11,640,750 ක වර්ධනයක් විය. වැටුප් වේතන හා සේවක ප්‍රතිලාභ රු.91,611,471 කින් වැඩි වුවද සංචාරක සංවර්ධන බදු ආදායම රු.37,124,844 කින් හා බලපත්‍ර ගාස්තු රු.63,503,290 සහ වෙනත් ආදායම් රු.16,259,224 කින් වැඩි වීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ හා 2014 වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයක් සිදුවී තිබුණි. එහෙත් 2014 වර්ෂයට සාපේක්ෂව2015 වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමක් සිදුවී තිබුණු අතර නැවතත් 2016 වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී එය වර්ධනය වී තිබුණි. කෙසේ වුවද,මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සහ රාජ්‍ය බදු නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු.381,486,482 ක් වූ අධිකාරියේ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු.623,332,169 ක් වී තිබුණි.

3.2 ආයතනයට එරෙහිව හා ආයතනය විසින් ආරම්භකර ඇති නෛතික සිද්ධි

අධිකාරිය විසින් බාහිර පුද්ගයන්ට එරෙහිව අධිකරණයේ නඩු 03 ක් ගොනු කර තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය අනුව 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කර ගත් ක්‍රියාකාරකම් ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු අතර, එම පරිච්ඡේදයේ (3) උපවගන්තිය අනුව අදාල වර්ෂය තුල වාර්ෂික අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලැස්ම (Activity Plan), ක්‍රියාත්මක කාල රාමුව (Time Line) හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමවුම් / ප්‍රතිඵල (Output/Outcome) ඇතුළත් විය යුතුය. සංචාරක සංවර්ධන අධිකාරිය විසින් ඉහත පරිදි ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ආ) ඉහත චක්‍රලේඛයේ 04 (ඇ) ඡේදය අනුව ක්‍රියාකාරී සැලැස්ම වාර්ෂික අයවැය පදනම් කර ගත යුතු වුවද, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව ආයතනයේ එක් එක් අංශයේ වියදම් සඳහා ඇස්තමේන්තු කර ඇති මුදල රු.මිලියන 1,979.8 ක් වූ අතර සත්‍ය වියදම රු.571.32 ක් විය. මේ අනුව වියදම් ඇස්තමේන්තු කිරීමේදී අධි ඇස්තමේන්තු ගත කර ඇති බව නිරීක්ෂණය විය.

4.1.2 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව, වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් 111 අතුරින් වර්ෂය තුළ ක්‍රියාත්මක කර තිබුණේ ක්‍රියාකාරකම් 37 කි. එනම් සියයට 33.33 කි. වර්ෂය තුළ ආරම්භ කළ ක්‍රියාකාරකම් අතුරින් සියයට 50 කට අඩුවෙන් මුදල් වැය කළ ක්‍රියාකාරකම් 22 ක් වූ අතර 2017 දෙසැම්බර් 31 දිනට මුදල් වැය නොවූ ක්‍රියාකාරකම් 66 ක් වූ අතර, ඒ සඳහා රු.මිලියන 681.83 ක් වෙන් කර තිබුණි.

(ආ) අධිකාරියේ අයිතිය හා කළමනාකරණය යටතේ සංචාරක නිවාඩු නිකේතන 04 ක් සහ සංචාරක නිකේතන 03 ක් පැවතුණි. අධික පොදු කාර්ය වියදම් හේතුකොටගෙන නිවාඩු නිකේතන 05ක් රු. 28,348,616 ක ඌනතාවක් ජනිත වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී සියලුම නිකේතනවල ශුද්ධ පාඩුව රු. 3,391,757 ක් වී තිබුණි. නිකේතන 05 ක පහසුකම් සැලැසීම හා සේවා කිරීම සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදන වලින් සියයට 21 ක් පමණක් වැයකර තිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා ඉඩම් බදු දීම අධිකාරිය මගින් සිදුකරනු ලබන අතර ත්‍රිකුණාමලය, යාල පලටුපාන හා කල්කුඩා සංචාරක ප්‍රදේශ වලට අයත් ඉඩම් බදු දීම පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ත්‍රිකුණාමලය කුච්චවේලි ප්‍රදේශයෙන් අධිකාරිය වෙත පවරාගන්නා ලද ඉඩම් අක්කර 510 කට ආසන්න ප්‍රමාණයකින් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් බදු දී තිබුණේ ඉඩම් අක්කර 30ක් පමණි.

(ආ) සංචාරක සංවර්ධන කටයුතු සඳහා යාල පලටුපාන ප්‍රදේශයෙන් අධිකාරියට පවරාගෙන ඇති අක්කර 1110 ක භූමියෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා ආයෝජකයන් වෙත බදු පදනම් මත ලබා දී තිබුණේ අක්කර 63 ක් පමණි.

(ඇ) කල්කුඩා (පාසිකුඩා) සංචාරක ප්‍රදේශයට අයත් අක්කර 202 කින් සමාලෝචිත වර්ෂ අවසානයට බදු දී තිබුණේ අක්කර 103 ක් වූ අතර කල්පිටිය හා අවට දූපත් වලින් පවරා දී තිබූ අක්කර 3986 කින් බදු දී තිබුනේ අක්කර 177 ක් පමණි.

4.3 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1969 වර්ෂයේදී සංචාරක කර්මාන්තය සඳහා ලංකා සංචාරක මණ්ඩලයටද, පසුව සංචාරක සංවර්ධන අධිකාරියට පවරා දෙන ලද බෙන්තොට සංචාරක නිවාඩු නිකේතනයට අයත් අක්කර 94 ක පමණ භූමියෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම උපයෝජනය කර තිබුණේ අක්කර 54 ක පමණ භූමි ප්‍රමාණයකි. මේ අනුව වර්ෂ 46 කට වැඩි කාලයක් අක්කර 40 කට වැඩි භූමි ප්‍රමාණයක් නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) බෙන්තොට ජාතික නිවාඩු නිකේතන භූමියේ පිහිටි වර්ග අඩි 2880 ක පමණ ගොඩනැගිලි ඉඩ ප්‍රමාණයක් 2006 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කිසිදු ආර්ථිකමය කටයුත්තකට යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) අධිකාරියට පවරා දී ඇති එහෙත් අධිකාරිය බදු ආදායම් නොලබන අක්කර 69 ක වපසරියක් සහිත ඉඩම් හා ගොඩනැගිලි 10ක් පැවතුණි.

(ඈ) බිබිල සහ රාගල ප්‍රදේශවල නිවාඩු නිකේතන 2 ක් පැවැති නමුත් මෙම නිකේතන ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගෙන ආදායම් ඉපයීමට කටයුතු කර නොතිබුණි.

4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් තනතුරු නාම15 ක් යටතේ තනතුරු 226 ක් ලෙස අධිකාරියේ කාර්ය මණ්ඩලය අනුමත කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ තත්‍ය සේවක සංඛ්‍යාව 195 ක් වූ අතර පුරප්පාඩු සංඛ්‍යාව 31 වී තිබුණි.

5 තිරසාර සංවර්ධනය

---

5. 1 තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳව එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි.

6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීරීඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාර ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වුවත් 2017 මූල්‍ය ප්‍රකාශන 2018 ජූනි 22 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.

6.2 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණනය සැලැස්මට අනුව විෂයයන් 13 ක විගණන කටයුතු සැලසුම් කර තිබූ නමුත් ඉන් විෂයයන් 07 ක් විගණනය සිදු කර නොතිබුණි.

6.3 ප්‍රසම්පාදන හා ක්‍රොන්තාත් ක්‍රියාවලිය

6.3.1 ප්‍රසම්පාදනයන්

2014 ජුනි සිට මධ්‍යම වායුසමීකරණ පද්ධතිය ස්ථාපිත කිරීමට සැලැසුම් සකස් කරමින් තිබූ අතර 2018 සැප්තැම්බර් 30 දින දක්වා එම කාර්යය වෙනුවෙන් ආසන්න වශයෙන් රු.14,029,949 ක මුදලක් වැයකර තිබුණි. මෙම ප්‍රසම්පාදන කාර්යය සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 5.3.5 ඡේදයට අදාල අතිරේක 9 ප්‍රකාරව ඉදිකිරීම් ඇස්තමේන්තු වටිනාකම මිලියන 60 ක් ඉක්මවූ මෙම වායුසමීකරණ කොන්ත්‍රාත්තුව වෙනුවෙන් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ EM I ශ්‍රේණියේ ලියාපදිංචිය සහිත කොන්ත්‍රාත්කරුවන්ගේ ලංසු කැඳවිය යුතු නමුත් 2017 ජුනි 07 දින පල කළ පුවත්පත් දැන්වීමට අනුව මෙය EM 2 හෝ ඊට වැඩි සුදුසුකම් ඇති සැපයුම්කරුවන්ට/ අයදුම්කරුවන්ට අයදුම් කල හැකි බව දන්වා තිබුණි.

(ආ) 2017 නොවැම්බර් 27 දිනැති වැඩ ප්‍රදානය කිරීමේ ලිපිය අනුව එහි සඳහන් දින සිට දින 180 ක් ඇතුළත අදාළ කාර්යය නිමකල යුතු වුවද 2018 අගෝස්තු වන විට දින 283 ක පමණ කාලයක් ගත වී තිබුණද මූලික වැඩ කටයුතුවත් අවසන් කර නොතිබුණි.

6.3.2 ප්‍රමාද වූ ව්‍යාපෘති

2016 පෙබරවාරි 10 දින ආරම්භ කර 2016 ජුනි 08 දින නිම කළ යුතුවූ පාසිකුඩා ජලසම්පාදන ව්‍යාපෘතියේ, බිම් ජලාශය, පොම්පාගාරය ආරක්ෂිත කුටිය ඉදිකිරීම හා වැඩබිම් වැඩ වෙනුවෙන් කොන්ත්‍රාත්තුව රු.22,258,780 ක්‍රොන්ත්‍රාත් වටිනාකමට පෞද්ගලික ආයතනයට 2016 මාර්තු 02 දින පවරා තිබුණි. විගණිත දිනය වන විටත් මෙම කොන්ත්‍රාත්තුවට අදාල අවසන් බිල් පත ඉදිරිපත් කර නොමැති අතර කාර්යය නිමකළ බවට නිර්දේශයන් ලබා දී නොතිබුණි. දින 119 කින් නිමකළ යුතු මෙම කොන්ත්‍රාත්තුව මේ වන විට වසර 2 කට වඩා ප්‍රමාද වී තිබුණද ඉදිකිරීම් අවසන් කර නොතිබුණි. තවද කොන්ත්‍රාත්තුව සඳහා ඉදිරිපත් කර තිබුණු කාර්යසාධන ඇපකරයද කල් ඉකුත් වී තිබුණි.

6.4 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 19 ක ඇස්තමේන්තුගත හා තථ්‍ය වියදම් අතර සියයට 25 සිට සියයට 405 දක්වා පරාසයක විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කලමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

6.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය ප්‍රකාරව අධිකාරියේ 2016 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2018 සැප්තැම්බර් 10 දින දක්වා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

6.6 නොවිසඳී ඇති විගණන ඡේද

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කල්පිටිය තොරයිඅඩි ජැටිය ඉදිකිරීම සහ වන්නිමුන්දලම කලපුව අසල තාර දැමීම සඳහා කළුගල්,බොරළු හා ඒ.බී.සී.සැපයීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) වෙළෙඳපල මිල සැසඳුම් ක්‍රමය යටතේ, කළුගල් සැපයීමට තෝරාගත් සැපයුම්කරු වෙනුවට ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ අභිමතය පරිදි වෙනත් පුද්ගලයෙකුගෙන් කළුගල් කියුබ් 1648 ක් වැඩි මිලට මිලදී ගැනීම නිසා රු.824,000 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණ අතර එම මුදල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම අයකරගෙන නොතිබුණි.

(ii) කල්පිටිය වැඩබිමට කළුගල්,බොරළු සහ ඒ.බී.සී සැපයීම සඳහා යොදාගත් බවට සඳහන් ටිපර් රථයක ධාරිතාවය කියුබ් 3 ක් වුවද කියුබ් 4 බැගින් ද්‍රව්‍ය සැපයූ ලෙස සලකා ගෙවීම් කිරීම නිසා වැඩිපුර ගෙවූ රු.2,549,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) කළුගල් කියුබ් 1648 ක්, ඒ.බී.සී කියුබ් 368 ක් සහ බොරළු කියුබ් 40 ක් ලෙස භෞතිකව භාර නොගත් ද්‍රව්‍ය වටිනාකම වූ රු.10,196,000 ක් සඳහා අධිකාරිය විසින් ගෙවීමකර තිබුණි.

(ආ) කතරගම සංචාරක නිවාඩු නිකේතනයේ සිදුකළ අළුත්වැඩියා කටයුතුවලට වැඩිපුර ගෙවන ලද රු.11,089,228 ක් වගකිව යුතු නිලධාරීන්ගෙන් මේ දක්වා අයකර ගෙන නොතිබුණි.

(ඇ) කල්පිටිය මොහොට්ටුවාරම ජැටිය ඉදිකිරීමේ කටයුතු සඳහා ඩෝසර් යන්ත්‍ර සැපයූ බවට සැපයුම්කරුවන් ඉදිරිපත් කළ ලිපි තුනක් පදනම් කරගෙන පැය 941.7 ක් සඳහා රු.3,226,950 ක මුදලක් ගෙවා තිබුණි. එහෙත් මෙම ඩෝසර් යන්ත්‍ර සේවය ලබාගත් බවට දිනපතා මනු කියවා වැඩ පැය සටහන්කර එම වැඩ පැය වාර්තා අධිකාරියේ නිලධාරියෙකුගෙන් සහතික කරගැනීමකින් තොරව මෙම ගෙවීම් සිදුකර තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘති වැඩ පරීක්ෂක විසින් ට්‍රැක්ටර් සේවාව සතුටුදායක ලෙස ලබා ගත් බවට උක්ත ලිපි තුනේ සහතික කර තිබුණි.

(ඈ) අධිකාරිය විසින් අවශ්‍යතාවය ඇගයීමකින් තොරව සෝපා පුටු 55 ක් මිලදී ගැනීමට රු.2,659,875 ක් වැයකර තිබුණි. මෙම පුටු මිලදී ගැනීමට සීමිත මිල ගණන් කැඳවා තිබුණද ආදර්ශ පුටුව සැපයූ ආයතනයෙන් මිල ගණන් ලබා ගෙන නොතිබුණි. පුටු මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 වගන්තිය පටහැනිව අත්තිකාරම් ලෙස මුළු සැපයුම් වටිනාකමින් සියයට 50 ක් ගෙවා තිබුණ අතර අවස්ථා කීපයකදී පුටු ප්‍රවාහනය වෙනුවෙන් රු.211,000ක නිශ්කාර්ය වැයක්ද දරා තිබුණි.එසේම රු.159,803 ක් වටිනා පුටු 03 ක් අස්ථානගත වී තිබුණි.

(ඉ) කල්පිටිය ඒකාබද්ධ සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය එක්සත් ජනපද ඩොලර් මිලියන 30 ඉක්මවූ ව්‍යාපෘතියක් වශයෙන් වර්ගකර වැටුප් හා දීමනා ගෙවා තිබීම හේතුවෙන් 2009 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා නිළධාරීන් වෙත වැඩිපුරගෙවා තිබූ රු.3,780,253 ක මුදල අධිකාරියට අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

(ඊ) පාසිකුඩා සංචාරක නිකේතන ව්‍යාපෘතියේ වැසි වතුර බැස යාමේ කාණු පද්ධතිය ඉදිකිරීම් භෞතිකව පරීක්ෂා කිරීමේ දී අදාළ භූමියේ භූ විෂමතාව සැලකිල්ලට ගෙන ඉදිකිරීම් සිදු නොකිරීම හේතු කොටගෙන කාණු පද්ධතියේ ජලය රැඳීතිබෙන බව විගණනයට නිරීක්ෂණය වූ අතර විගණනයේදී ගණනය කළ තත්‍ය මිණුම් වාර්තා,බිල්පත්වල සඳහන් ගෙවීම් ප්‍රමාණයන් සමග සැසඳීමේදී රු.3,792,420 ක මුදලක් කොන්ත්‍රාත්කරුවන් වෙත වැඩිපුර ගෙවා ඇති බව නිරීක්ෂණය විය.

(උ) අධිකාරියේ "වන් ස්ටොප්" ආයෝජනයන් ප්‍රවර්ධනය කිරීම සඳහා වෙබ් අඩවිය නිර්මාණය කිරීමේ කොන්ත්‍රාත්තුවට අදාළව රු.699,300 ක් වැඩිපුර ගෙවා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මෙම මුදල ආපසු අය කර ගෙන නොතිබුණි.

(ඌ)2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතන චක්‍රලේඛයේ 8 ඡේදයේ කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම සඳහා වන නිර්දේශවලට පටහැනිව 2009 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා බෙන්තොට පල්දෝරු පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ ශ්‍රම කොන්ත්‍රාත්තුව ප්‍රසම්පාදන පරිපාටියෙන් තොරව පුද්ගලික ආයතනයක් වෙත පවරා දී තිබුණි.

(එ) පාසිකුඩා සංචාරක කලාපයේ ජාතික නිවාඩු නිකේතනයේ කිලෝමීටර් 1.126 ක පිවිසුම් මාර්ගය කාපට් කිරීමේ පිරිවැය ඇස්තමේන්තුව ව්‍යාජ ලෙස අදියර 04 කට කොටස් කර ප්‍රසම්පාදන පරිපාටි අනුගමනය කිරීමෙන් තොරව කොන්ත්‍රාත්කරු තෝරාගෙන තිබූ අතර ඉදිකිරීම් සඳහා රු.22,013,564 ක මුදලක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා මෙම මුදල ආපසු අය කර ගෙන නොතිබුණි.

7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

	පද්ධති හා පාලන ක්ෂේත්‍ර	නිරීක්ෂණ
(අ)	මෙහෙයුම් පාලනය	(i) සංවර්ධන වැඩසටහන් අධිකාරියේ ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව සිදු නොකිරීම
		(ii) භෞතික ප්‍රගතිය පිළිබඳ ව වාර්තා කිරීමට වැඩපිළිවෙලක් සකස්කර නොතිබීම.
		(iii) ප්‍රසම්පාදන කාර්යය පැහැර හැරි සැපයුම්කරුවන් වෙනුවෙන් අසාදු ලේඛණයක් පවත්වා නොගැනීම.
		(iv) ප්‍රසම්පාදනයන් සඳහා ඇස්තමේන්තු සැකසීමේදී තාර්කික ප්‍රවේශයන් අනුගමනය නොකිරීම.
		(v) සැපයුම්කරුවන්ගෙන් විධිමත් පරිදි වගකීම් සහතික ලබා නොගැනීම.
(ආ)	ව්‍යාපෘති පාලනය	(i) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඒවා අධීක්ෂණය හා ගෙවීම් නිර්දේශ කිරීමේදී හා අනුමත කිරීමේදී කළ වැඩ වාර්තා පරීක්ෂාවකින් තොරව ගෙවීම් සිදුකර තිබීම.

	(ii) කොන්ත්‍රාත්තු ලේඛණයක් පවත්වා නොගැනීම.
(ඇ) වත්කම් කළමනාකරණය	(i) වත්කම් ලේඛන යාවත්කාලීනව පවත්වා නොගැනීම. (ii) වත්කම් වල අයිතිය පවරා ගැනීමට කටයුතු නොකිරීම.
(ඈ) ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ පාලනය	ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු නොකිරීම.
(ඉ) ගිණුම්කරණය	(i) ඇතැම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කිරීමේදී දුර්වලතා පැවතීම. (ii) ඇතැම් ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් නොකිරීම. (iii) ප්‍රාග්ධන වත්කම් ගිණුම් කැබීමට අදාළ මූලික ලියකියවිලි නොමැතිව ගිණුම් කැබීම් සිදුකර තිබීම.

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
අංක. 80, ගාලු පාර, කොළඹ 03, ශ්‍රී ලංකාව.
www.sltda.gov.lk